# සටහන


2020 ඔක්තෝබර් - දෙසැම්බර්
39 වෙළුම 10 - 12 කලාපය

2 බංග්ලාදේශයේ සමාජ, ආර්ථික තොරතුරු බිඳක්

3 ව්‍යවහාරික විගණනයක කාර්යභාරය කුමක්ද?

10 සාම්ප්‍රදායික නොවන මුදල් ප්‍රතිපත්තිය

15 විදේශීය සංචාරකයින් ගෙදර වගේ නවතින නිවෙස් නවාතැන්



රු. 20/-

ISSN 1391-3697
9 770041 001687 02010

ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව






# බංග්ලාදේශය

## සමාජ, ආර්ථික තොරතුරු බිඳක්...



ලොව ජනගහනය වැඩි ම රටවල් අතරින් 8 වන තැන ගන්නා බංග්ලාදේශය බටහිරෙන්, උතුරෙන් සහ නැගෙනහිරෙන් ඉන්දියාවෙන් ද, ගිනිකොන දිගින් මියැන්මාරයෙන් ද දකුණෙන් බෙංගාල බොක්කෙන් ද සීමා වූ දකුණු ආසියාතික රාජ්‍යයක්. එය නේපාලයෙන් සහ භූතානයෙන් වෙන් වී තිබෙන්නේ ඉන්දියාවට අයත් ඉතා පටු ගොඩබිම් තීරයකින්.

රාමායණය, මහාභාරතය වැනි පුරාවෘත්තයන්හි පවා සඳහන් අයෝධ්‍යාව පිහටා තිබුණේ වංග රාජ්‍යය නමින් පතළ ව තිබූ මෙම භූමි ප්‍රදේශයේ බව කියැවෙනවා. අශෝක රජතුමාගේ මෞර්ය අධිරාජ්‍යයට අයත් ව තිබූ මේ භූමිය එ කල ඈත පෙරදිග රටවල් සමග වෙළෙඳ සබඳතා ගොඩනගා ගෙන තිබුණා. අනතුරු ව රාජවංශ කිහිපයක ම පාලනයට යටත් ව තිබූ වංග දේශය පසු ව ක්‍රමයෙන් ඉස්ලාම් ආධිපත්‍යයට නතු වී කලක් මෝගල් අධිරාජ්‍යය යටතේ ද පාලනය වුණා. 1947 අගෝස්තුවේ දී භාරතය ඉංගිරිසීන් ගෙන් නිදහස ලබද්දී මෙය “නැගෙනහිර පකිස්තානය” නමින් බෙදී වෙන්වුණා. ඒ අභිනවයෙන් ස්ථාපිත කරන ලද “පකිස්තානය” නම් රාජ්‍යයේ කොටසක් ලෙසයි. ඉන් පසු දීර්ඝ කාලයක් තිස්සේ නැගෙනහිර පකිස්තානුවන්ගේ සහභාගීත්වයෙන් සිදු වූ විප්ලවකාරී නැගිටීම්වල ප්‍රතිඵලයක් ලෙස 1971 දී “බංග්ලාදේශය” නම් නිදහස් ස්වාධීන රාජ්‍යය බිහි වුණා.n

මූලාශ්‍ර - World Fact Book
Wikipedia විශ්වකෝෂය

| | |
|---|---|
| භූමි ප්‍රමාණය<br>මුළු ප්‍රමාණය වර්ග කි.මී.<br>ගොඩ බිම් ප්‍රමාණය වර්ග කි.මී.<br>අභ්‍යන්තර ජලාශ වර්ග කි.මී. | <br>148,460<br>130,170<br>18,290 |
| ජනගහනය (2020 ඇස්තමේන්තු) | 162,650,853 |
| ජනගහන වර්ධන වේගය (2020 ඇස්තමේන්තු) | 0.98% |
| උපත් අනුපාතය (2020 ඇස්තමේන්තු)<br>(ජනගහනය දහසකට) | 18.1 |
| මරණ අනුපාතය (2020 ඇස්තමේන්තු)<br>(ජනගහනය දහසකට) | 5.5 |
| ළදරු මරණ අනුපාතය (2020 ඇස්තමේන්තු)<br>(සජීවී උපත් දහසකට) | 28.3 |
| උපතේ දී ජීවිත අපේක්ෂාව (අවුරුදු) (2020 ඇස්තමේන්තු) | 74.2 |
| දළ දේශීය නිෂ්පාදිතය (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 690.3 |
| මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය<br>(2017 ඇස්තමේන්තු) | 7.4% |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් 4,200 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය (2017 ඇස්තමේන්තු)<br>කෘෂිකර්මය<br>කර්මාන්ත<br>සේවා | <br>14.2%<br>29.3%<br>56.5% |
| ශ්‍රම බලකාය (2017 ඇස්තමේන්තු) | මිලියන 66.64 |
| සේවා වියුක්තිය (2017 ඇස්තමේන්තු) | 4.4% |
| කුටුම්භ ආදායමේ ගිනි සංගුණකය (2018 ඇස්තමේන්තු) | 30.7. |
| අයවැය අතිරික්තය (+) හෝ හිඟය (-) (2007 ඇස්තමේන්තු)<br>දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | -3.2% |
| උද්ධමන අනුපාතය (2017 ඇස්තමේන්තු) | 5.6% |
| ආනයන (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 47.56 |
| ආනයන භාණ්ඩ | කපු, යන්ත්‍ර සූත්‍ර, රසායන ද්‍රව්‍ය, යකඩ සහ වානේ, ආහාර ද්‍රව්‍ය |
| අපනයන (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 35.3 |
| අපනයන භාණ්ඩ | ඇඟළුම්, කෘෂිකාර්මික නිෂ්පාදන, මත්ස්‍ය නිෂ්පාදන, හණ නිෂ්පාදන, සම් භාණ්ඩ |
| මුදල් ඒකකය | ටකා |

සටහන

“සටහන” සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

ශ්‍රී ලංකා මහ බැංකුව නමට ලියන ලද මුදල් ඇණවුම්/චෙක්පත් මෙහි සඳහන් ලිපිනයට එවීමෙන් “සටහන” තැපෑලෙන් ගෙන්වා ගත හැකි ය.

පිටපතක මිල : රු. 20.00
වාර්ෂික දායකත්වය : රු. 320.00
(තැපැල් ගාස්තු ද ඇතුළත්ව)

අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590, කොළඹ

# වෝහාරික විගණනයක කාර්යභාරය කුමක්ද?

**සුරේකා කැටවල**
**නියෝජ්‍ය අධ්‍යක්ෂිකා**
**ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තුමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

වංචනික ක්‍රියාකාරකම් සහ අක්‍රමවත් මූල්‍ය ගනුදෙනු ලොව පුරා දිනෙන් දින වර්ධනය වෙමින් පවතී. මෙවැනි ක්‍රියාකාරකම් සහ ගනුදෙනු අන් කවරදාටත් වඩා නවීන හා සංකීර්ණ ආකාරයෙන් සිදු වේ. මේ නිසා විවිධ ව්‍යාපාරික ආයතන වංචනික ක්‍රියාකාරකම් සහ ගනුදෙනු සඳහා නිරාවරණය වීමේ දැඩි අනතුරකට මුහුණ පා සිටී. පසුගිය දශක කිහිපය පුරාවට සිදු වූ අන්තර් ජාතික සමාගම් ආශ්‍රිත ගිණුම් වංචා සහ ඉහළ පෙළේ ආයතනික වංචා මේ බව තවදුරටත් සනාථ කරයි. එන්රොන්, වර්ල්ඩ්කොම්, සත්‍යම් කම්පියුටර්ස් වැනි ආයතන සම්බන්ධ වංචා මේ සඳහා උදාහරණ කීපයක් ලෙස දැක්විය හැකි ය. මෙවැනි ආයතනික වංචා සහ වෙනත් වංචනික ක්‍රියාකාරකම්, වෝහාරික විගණන ක්ෂේත්‍රය කර්මාන්තයක් ලෙස අද පවතින තත්ත්වයට සංවර්ධනය වීමට බලපෑ ප්‍රධාන හේතුවක් වේ.

## වෝහාරික විගණනයක් යනු කුමක්ද?

වෝහාරික යන්නට ඉංග්‍රීසි භාෂාවෙන් භාවිත වන්නේ forensic යන වදනයි. ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයට අනුව forensic යන්නෙහි අර්ථය වන්නේ "relating to or denoting the application of scientific methods and techniques to the investigation of crime"ය. ඒ අනුව වෝහාරික යනු "අපරාධ පරීක්ෂණය සඳහා විද්‍යාත්මක ක්‍රම සහ තාක්ෂණය යොදා ගැනීම" ලෙස අර්ථ දැක්විය හැකි ය. වෝහාරික විගණනයක් යනු උසාවියක හෝ නීතිමය ක්‍රියාමාර්ගයක දී භාවිත කළ හැකි සාක්ෂි ලබා ගැනීම සඳහා ආයතනයක හෝ පුද්ගලයකුගේ මූල්‍ය හා වෙනත් අදාළ වාර්තා පරීක්ෂා කිරීම සහ ඇගයීම සඳහා වන විධිමත් ප්‍රවේශයකි. වෙනත් වචනවලින් කිවහොත්, එය අධිකරණයක් විසින් විභාග කරනු ලබන මූල්‍ය ගැටලු, අපරාධ සහ වංචා විසඳීම සඳහා විමර්ශනාත්මක හා විශ්ලේෂණාත්මක කුසලතා භාවිතාවේ යෙදවීමකි. සොයා ගනු ලබන නිරීක්ෂණ අධිකරණ විභාගයක දී භාවිත කිරීමට සම්භාවිතාවක් තිබෙන අවස්ථාවල දී සාමාන්‍ය විගණනයක් වෙනුවට වෝහාරික විගණනයක් කිරීම නිර්දේශ කෙරේ.

වෝහාරික විගණනය සඳහා ගිණුම්කරණය, වංචා විගණන ක්‍රමවේද මෙන් ම අදාළ වන නෛතික රාමුව පිළිබඳ ව මනා පරිචයක් තිබීම අත්‍යවශ්‍ය වේ. ඊට අමතර ව මූල්‍යකරණය, තොරතුරු තාක්ෂණය, ප්‍රමාණාත්මක ක්‍රමවේද මෙන් ම වෝහාරික ඩිජිටල්කරණය යන ක්ෂේත්‍රවල විශේෂ කුසලතා තිබීම ද අත්‍යවශ්‍ය වේ.

## වෝහාරික විගණන විධි ක්‍රමය විකාශනය වූයේ කෙසේ ද?

වෝහාරික විගණනය සම්බන්ධයෙන් වන ඉතිහාසය පිරික්සීමේ දී 1930 පමණ වන තෙක් ඒ සම්බන්ධයෙන් පැහැදිලි සඳහනක් නොමැති බව පෙනී යයි. 1930 ගණන්වල එක්සත් ජනපද දේශීය ආදායම් සේවයේ සේවය කළ ෆ්‍රෑන්ක් විල්සන් නම් සහතිකලත් රාජ්‍ය ගණකාධිකාරිවරයකු වෝහාරික විගණනයේ මූලිකයා ලෙස හඳුනා ගැනේ. නීති විරෝධී ක්‍රියා ගණනාවකට

සම්බන්ධ අල් කපෝන් නම් අපරාධකරුවකුගේ ගනුදෙනු විමර්ශනය කිරීමේ කාර්යය ෆ්‍රෑන්ක් විල්සන්ට පැවරෙන ලදී. කපෝන්ගේ මූල්‍ය වාර්තා පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් විල්සන් විසින් සිදු කරනු ලැබූ අතර කැපෝන් විසින් සිදු කරනු ලැබූ ආදායම් බදු වංචාවක් සොයා ගැනීමට ඒ අනුව හැකි විය. විමර්ශන මත පදනම් ව, ෆෙඩරල් ආදායම් බදු වංචාව සම්බන්ධයෙන් කපෝන්ට චෝදනා ගොනු කරනු ලැබූ අතර, නීති විරෝධී ලෙස සිදු කරනු ලැබූ සූදුවලින් ලද ලාභයෙන් එක්සත් ජනපද රජයට ඩොලර් 215,080.48ක් අය විය යුතු බවත්, බදු පැහැර හැරීමේ චෝදනාවට වරදකරු වන බවත්, නිගමනය කර වසර 10ක සිර දඬුවමක් නියම කෙරුණි. ප්‍රසිද්ධියට පත් තොරතුරුවලට අනුව, චෝහාරික විගණනයේ ප්‍රායෝගික භාවිතය සම්බන්ධයෙන් පළමු වරට හෙළිදරව් වන අවස්ථාව මෙය වේ.

එතැන් සිට චෝහාරික විගණන වෘත්තිය වසර ගණනාවක් පුරාවට සැලකිය යුතු ආකාරයෙන් විකාශනය වී ඇත. එම සංවර්ධනයට සමාජීය සහ ආර්ථික ක්ෂේත්‍රවල සිදු වූ වෙනස්කම්, අධිකරණ ක්‍රියාවලියේ සිදු වූ පරිවර්තනයන් මෙන් ම තාක්ෂණික දියුණුව ද හේතු පාදක විය.

ඉතිහාසය සමාලෝචනය කරන විට, ඇමරිකා එක්සත් ජනපදයේ "සර්බන්ස්-ඔක්ස්ලි 2002 පනත" මගින් චෝහාරික විගණන වෘත්තියේ ප්‍රගමනයට ඉහළ දායකත්වයක් ලබා දී ඇති බව පැහැදිලි ය. මෙම පනත අභ්‍යන්තර විගණකවරුන්ගේ කාර්යභාරය සහ ආයතනික කළමනාකරණය විධිමත් කිරීමේ මූලික අරමුණින් ඉදිරිපත් කරන ලද පනතක් වුව ද එය චෝහාරික විගණන වෘත්තියට නව අවස්ථා උදා කර දීමට ඉවහල් විය. මෙම පනතට පසු ව, චෝහාරික විගණකවරුන්ගේ සේවය සඳහා ඇති ඉල්ලුම වර්ධනය වූ අතර ඊට ප්‍රධාන වශයෙන් ම හේතු පාදක වූයේ පනත මගින් රහස්‍ය තොරතුරු හෙළි කරන්නන් (Whistle Blowers) සඳහා සැලසූ නෛතික ආවරණය ය.

චෝහාරික විගණන විෂයය විකාශනය වීමත් සමඟ එමගින් ආවරණය කෙරෙන විෂය පරාසය ද පුළුල් විය. අද වන විට මුදල් විශුද්ධිකරණය, වංචා විමර්ශණය, වත්කම් හා වත්කම් රැස් කළ පුද්ගලයින් හඳුනා ගැනීම, අපරාධ පරීක්ෂණය, සාවද්‍ය මූල්‍ය වාර්තාකරණය, අරමුදල් අයථා ලෙස පරිහරණය කිරීම, බරපතල අපරාධවලින් රැස් කළ මුදල් නැවත අය කර ගැනීම, මූල්‍ය විෂමාචාරය සහ අවභාවිතය වැනි ක්ෂේත්‍ර ගණනාවකට අදාළ විමර්ශන සඳහා චෝහාරික විගණනය භාවිත කෙරේ. ඊට සමගාමී ව මෙම ක්ෂේත්‍රයේ වෘත්තීය ගුණාත්මකභාවය සහතික කිරීම සහ වෘත්තිකයන්ගේ සදාචාරාත්මක හැසිරීම පවත්වා ගැනීම සඳහා විවිධ රටවල් විසින් විවිධ වර්ගයේ සංවිධාන පිහිටුවා ඇත. 1993 දී ඇමරිකා එක්සත් ජනපදයේ පිහිටුවන ලද ඇමරිකානු චෝහාරික ගිණුම්කරණ මණ්ඩලයත් 2016 දී එංගලන්තයේ සහ වේල්සයේ පිහිටුවන ලද චෝහාරික විගණන සහතික කිරීමේ මණ්ඩලයත් (Forensic Auditors Certification Board - FACB) මේ සඳහා උදාහරණ ලෙස දැක්විය හැකි ය.

තව ද, චෝහාරික විගණන ක්ෂේත්‍රයේ සංවර්ධනයත් සමඟ විවිධ ආයතන විසින් විවිධ වර්ගයේ සුදුසුකම් හඳුන්වා දී ඇත. චෝහාරික විගණන විෂයයේ ගුණාත්මකභාවය පවත්වා ගෙන යෑම සහ වැඩිදියුණු කිරීම සඳහා මෙම ආයතන වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. එවැනි ආයතන කිහිපයක් පහතින් දක්වා ඇත.

| වෘත්තීය සුදුසුකම | සුදුසුකම් ලබාදෙන ආයතනයේ නම |
|---|---|
| සහතිකලත් චෝහාරික විගණක | එංගලන්තයේ සහ වේල්සයේ චෝහාරික විගණකවරුන් සහතික කිරීමේ මණ්ඩලය - එක්සත් රාජධානිය |
| ▪ සහතිකලත් වෘත්තීය චෝහාරික ගණකාධිකාරි<br>▪ චෝහාරික ගණකාධිකරණ සහතිකය<br>▪ සහතිකලත් වංචා විමර්ශක විශේෂඥ | සහතිකලත් චෝහාරික විගණකවරුන්ගේ අන්තර්ජාතික ආයතනය - ඇමෙරිකා එක්සත් ජනපදය |
| සහතිකලත් වංචා පරීක්ෂක | සහතිකලත් වංචා පරීක්ෂකවරුන්ගේ සංගමය - ඇමෙරිකා එක්සත් ජනපදය |
| සහතිකලත් චෝහාරික ගණකාධිකාරි | ඇමෙරිකානු චෝහාරික ගණකාධිකාරි මණ්ඩලය |

| | |
|---|---|
| වෝහාරික විගණක සහ වංචා පරීක්ෂක සහතික පාඨමාලාව | ඉන්දීය වරලත් ගණකාධිකාරි ආයතනය |
| මූල්‍ය වෝහාරික ගණකාධිකාරි | සිංගප්පූරු වරලත් ගණකාධිකාරි ආයතනය |
| සහතිකලත් මූල්‍ය වෝහාරික | කැනේඩියානු වරලත් වෘත්තීය ගණකාධිකාරි ආයතනය |
| සහතිකලත් වෝහාරික ගණකාධිකාරි | සහතිකලත් වෝහාරික ගණකාධිකාරිවරුන්ගේ ආයතනය |
| සහතිකලත් රාජ්‍ය ගණකාධිකාරි - මූල්‍ය වෝහාරික සුදුසුකම සහිත | සහතිකලත් රාජ්‍ය ගණකාධිකාරි ආයතනය - ඇමෙරිකා එක්සත් ජනපදය |
| ■ වෝහාරික විගණක ඩිප්ලෝමාව<br>■ ව්‍යවහාරික වෝහාරික විගණනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය<br>■ ව්‍යවහාරික වෝහාරික විගණනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව<br>■ ව්‍යවහාරික වෝහාරික විගණන පශ්චාත් උපාධිය<br>■ වෝහාරික විගණනය පිළිබඳ දර්ශනපති උපාධිය | වෝහාරික විගණකවරුන්ගේ ආයතනය - සිම්බාබ්වේ |
| සම්මානිත සහ යාවජීව සාමාජික | පාකිස්ථානු වෝහාරික ගණකාධිකාරිවරුන්ගේ ආයතනය |
| ■ සහතිකලත් වෝහාරික ගණකාධිකාරි<br>■ යාවජීව වෝහාරික ගණකාධිකාරි | නයිජීරියානු වෝහාරික ගණකාධිවරුන්ගේ ආයතනය |

වෝහාරික විගණන ක්ෂේත්‍රයේ අඛණ්ඩ සංවර්ධනයත් සමග ගිණුම්කරණ සමාගම් රැසක් තම ආයතන තුළ වෙනම ම වෝහාරික විගණන අංශ ස්ථාපිත කර ඇත. ප්‍රකාශිත තොරතුරුවලට අනුව, එවැනි ගිණුම්කරණ සමාගම් කිහිපයක් පහත දැක්වේ:

| | |
|---|---|
| අර්නස්ට් ඇන්ඩ් යංග් | බේකර් ටිලී |
| කේපීඑම්ජී | මුවර් ස්ටීෆන්ස් |
| ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් | මසාර්ස් |
| 1. ඩෙලොයිට් ටච් ටොමොට්සු සමාගම | හෙයින්ස් වොට්ස් |
| ග්‍රාන්ට් තෝන්ටන් | ක්‍රොව් ක්ලාක් වයිට්හිල් |
| බීඩීඕ | සැෆ්රි චැම්ප්නස් |
| ආර්එස්එම් ටෙනන් | බෙග්බීස් ට්‍රේනෝ |
| ස්මිත් ඇන්ඩ් විලියම්සන් | යූඑච්වයි හැකර් යංග් |

### වෝහාරික විගණනවල අවශ්‍යතාව කුමක්ද?

- වංචා විමර්ශනය සඳහා - කිසියම් පාර්ශ්වයකට මූල්‍ය හෝ පෞද්ගලික වාසි ලබා ගැනීමේ අරමුණින් සැලසුම් සහගත ව සිදු කරනු ලබන නීති විරෝධී හෝ සාපරාධී ක්‍රියාවන් වංචා ලෙස හැඳින්විය හැකි ය. ඒවා හිතාමතා ම නො මග යවන සුළු ආකාරයේ ක්‍රියා වන අතර එමගින් වැරදිකරුවාට අයුතු ප්‍රතිලාභයක් ලැබේ. බැංකු, දේපළ වෙළෙඳාම්, ආයෝජන, රක්ෂණ, බදු යනාදී ක්ෂේත්‍රවල මෙවැනි වංචා සිදු වීමට ඇති ප්‍රවණතාව වැඩි අතර මෙවැනි වංචනික ක්‍රියාකාරකම් තනි

පුද්ගලයන් මෙන් ම ව්‍යාපාරික ආයතන විසින් ද සිදු කරනු ලබයි.

- දූෂණ විමර්ෂණය සඳහා - දූෂණ යනු බලයේ සිටින පුද්ගලයින් විසින් තම වාසිය උදෙසා සිදු කරනු ලබන වංක හෝ වංචනික ක්‍රියාකාරකම් ය. දූෂණ කටයුතු අතරට අල්ලස්, අයුතු බලපෑම්, ඥාති සංග්‍රහය, අනිසි අනුග්‍රහය, අයුතු ප්‍රයෝජන බලාපොරොත්තුවෙන් සිදු කරන පරිත්‍යාග, අලෙවිකරණය හරහා කරන අයථා බලපෑම්, අයථා පරිහරණය සහ බලය අනිසි ලෙස භාවිත කිරීම වැනි ක්‍රියාකාරකම් ඇතුළත් වේ.

- අයථා ලෙස එක් රැස් කළ වත්කම් විමර්ශනය සඳහා - අයථා ලෙස වත්කම් ඒකරාශී කිරීම ඉතා පුළුල් ව ව්‍යාප්ත ව ඇති ගැටලුවකි. මෙවැනි අවස්ථාවන්ට උදාහරණ ලෙස අයථා ලෙස මුදල් රැස් කිරීම, සැබෑවට ම නො සිටින සේවකයින්ට/සැපයුම්කරුවන්ට ගෙවීම් කිරීම, ව්‍යාජ ඉන්වොයිස ඉදිරිපත් කිරීම, වත්කම් අනිසි ලෙස භාවිත කිරීම, තොග/ඉන්වෙන්ටරි සොරකම් කිරීම දැක්විය හැකි ය.

- සාවද්‍ය මූල්‍ය ප්‍රකාශන විමර්ශණය සඳහා - ප්‍රසාද දීමනා අඛණ්ඩ ව ලබා ගැනීම, ඉලක්ක සපුරා ගත් බව පෙන්වීම, වැටුප් වර්ධක සහ උසස්වීම් ලබා ගැනීම වැනි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාජ සංඛ්‍යා ලේඛන ඇතුළත් කර ලාභ පෙන්වීම, වියදම් හා වගකීම් අඩුවෙන් පෙන්වීම මෙවැනි වංචාවල දී සිදු කෙරේ. හිතාමතා ම ගිණුම් වාර්තා ව්‍යාජ ලෙස සකස් කිරීම, මූල්‍ය ප්‍රකාශණ පිළියෙළ කිරීමේ දී වියදම් ඇතුළත් නො කිරීම හෝ අඩුවෙන් පෙන්වීම, ආදායම අධි තක්සේරු කර පෙන්වීම, වගකීම් සටහන් නො කිරීම/අවතක්සේරුව, අවශ්‍ය තොරතුරු අනාවරණය නො කිරීම හෝ මූල්‍ය වාර්තාකරණයේ ප්‍රමිතීන්වලින් බැහැර ව කටයුතු කිරීම මේ සඳහා උදාහරණ ලෙස දැක්විය හැකි ය.

## වෝහාරික විගණන ක්‍රියාවලිය

වෝහාරික විගණන ක්‍රියාවලියේ අදියරයන් ද සාමාන්‍ය මූල්‍ය විගණනයකට බොහෝ දුරට සමාන වේ. විගණන ගිවිසුම භාර ගැනීම, විගණනය සැලසුම් කිරීම, සංඛ්‍යාංක වෝහාරික විගණන ක්‍රමවේද ඇතුළු විගණන ක්‍රියා පටිපාටි සිදු කිරීම, සාක්ෂි එකතු කිරීම, විගණන වාර්තාව පිළියෙළ කිරීම සහ ඊට අමතර ව වෝහාරික විගණනය සඳහා අතිරේක අදියරක් ලෙස අවශ්‍ය වුවහොත් උසාවියේ පෙනී සිටීම යනාදිය වෝහාරික විගණන ක්‍රියාවලියට ඇතුළත් වේ.

විගණන ගිවිසුම භාර ගැනීමේ දී, වෝහාරික විගණක විසින් කරුණු කිහිපයක් සලකා බැලිය යුතු ය. අවංක හා අපක්ෂපාතී විගණනයක් සිදු කිරීම සඳහා වෝහාරික විගණක සෑම විට ම සේවාදායකයාගෙන්, එහි කළමනාකාරිත්වයෙන් මෙන් ම ඊට සම්බන්ධ පාර්ශ්වයන්ගෙන් ද ස්වාධීන විය යුතු ය. මේ අනුව, විගණකවරයෙකුට වෝහාරික විගණනයක් කිරීමට ආරාධනා කළ විට, පළමු පියවර විය යුත්තේ විගණකවරයා ස්වාධීන ද යන්නත් අදාළ කාර්යය කිරීම සඳහා විගණකවරයා අවශ්‍ය කුසලතා, දැනුම සහ වෝහාරික මෙවලම්වලින් පොහොසත් දැ යි විමසා බැලීම ය. වෝහාරික විගණක තමන් සතු මෙම නිර්ණායක පිළිබඳ ව සෑහීමකට පත්වන්නේ නම් පමණක් විගණනය භාරගත යුතු ය.

විගණනය සැලසුම් කිරීමේ දී, විගණක විසින් පහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විගණනය සැලසුම් කරනු ලබයි.

- වංචාව හඳුනා ගැනීම
- වංචාව සිදු වී ඇති කාල සීමාව තක්සේරු කර ගැනීම
- වංචාව ආවරණය කළ හෝ සැඟ වූ ආකාරය හඳුනා ගැනීම
- වැරදිකරුවන් හඳුනා ගැනීම
- වංචාවේ ප්‍රතිඵලයක් ලෙස සිදු ව ඇති අලාභය ගණනය කිරීම
- අධිකරණයේ දී පිළිගත හැකි සාක්ෂි රැස් කිරීම
- අනාගතයේ දී එවැනි වංචා නැවත සිදු වීම වැළැක්වීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කිරීම

විගණන ක්‍රියා පටිපාටීන්වල දී විගණනයේ ප්‍රායෝගික කාර්යයන් සහ ක්ෂේත්‍රය තුළ සිදු කරනු ලබන විගණන කටයුතු ඇතුළත් වේ. විගණනයට අදාළ වන ආයතනයේ හෝ පුද්ගලයාගේ සමස්ත ක්‍රියාදාමය පිළිබඳ ලේඛන

සහ තොරතුරු විගණක විසින් සමාලෝචනය කරනුයේ මෙම අදියරයේ දී ය. සත්‍ය තත්ත්වය නිරීක්ෂණය කිරීම සහ නිගමනවලට එළඹීම සඳහා වෝහාරික විගණක විසින් අභ්‍යන්තර පාලනයන්හි ඵලදායීතාව ඇගයීම, විශ්ලේෂණ ක්‍රියා පටිපාටි සිදු කිරීම, මෘදුකාංග යොදා ගැනීම සහ අවශ්‍ය පරිදි සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මෙම අවස්ථාවේ සිදු කරනු ලබයි.

සොයා ගනු ලබන සාක්ෂි වැරදිකරුවන්ගේ අනන්‍යතාය සනාථ කිරීමට මෙන් ම වංචාව සම්බන්ධයෙන් පැහැදිලි අදහසක් ලබා ගැනීමට තරම් ප්‍රමාණවත් විය යුතු ය. ඊට අමතර ව, වංචාවෙන් සිදු වූ අලාභ ගණනය කිරීමට සහ වංචාව නිසා පීඩාවට පත් වූ පාර්ශ්වයන් හඳුනා ගැනීමට ද ලේඛනමය සාක්ෂි එක් රැස් කළ යුතු ය. තාර්කික ලෙස පෙළ ගැස්වූ සාක්ෂි, සිදු වූ වංචාව උසාවියට නිවැරදි ව තේරුම් ගැනීමට උපකාරී වනු ඇත. සාක්ෂි රැස් කිරීම සඳහා, විගණක විසින් පහත සඳහන් ශිල්පීය ක්‍රම භාවිත කළ හැකි ය.

- වංචාව සිදු වීමට ඉඩකඩ විවර වූ අභ්‍යන්තර පාලන ක්‍රමවේදවල ඇති අඩුපාඩු හඳුනා ගැනීම සඳහා පරීක්ෂා සිදු කිරීම
- පරිගණක පද්ධතියේ සිදු කර ඇති වෙනස්කම් හඳුනා ගැනීම සඳහා පරිගණක ආශ්‍රිත විගණන තාක්ෂණය භාවිත කිරීම
- සංඛ්‍යාංක වෝහාරික විගණනය සහ වෝහාරික දත්ත විශ්ලේෂණය භාවිතයට ගැනීම
- සේවකයින් සහ වෙනත් අදාළ පාර්ශ්වයන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම
- හඬ පටි සහ දුරකථන වාර්තා වැනි විද්‍යුත් සාක්ෂි සමාලෝචනය
- රැස්වීම් වාර්තා, ගිණුම් වාර්තා, වවුචර්, බැංකු ප්‍රකාශන වැනි වෙනත් ලේඛනමය සාක්ෂි විශ්ලේෂණය

මීට අමතර ව, එකතු කරන ලද ලියකියවිලි සහ වෙනත් සාක්ෂිවලට හානි නො වන බවටත්, කිසිවෙකු විසින් වෙනස් නො කරන බවටත්, ප්‍රතිසංස්කරණය නො කරන බවටත් වෝහාරික විගණක විසින් සහතික විය යුතු අතර ඒ සඳහා ප්‍රමාණවත් ආරක්ෂාවක් ලබා දිය යුතු ය.

වෝහාරික විගණන ක්‍රියාවලියේ අවසාන ප්‍රතිඵලය වන්නේ විගණන වාර්තාව ය. සේවාදායකයාගේ අභිමතය පරිදි වෝහාරික විගණනය මත නඩුවක් පැවරීමට අදහස් කරනු ලබන්නේ නම් උසාවියේ දී සාක්ෂි ලෙස භාවිත කරන්නේ මෙම වාර්තාව ය. වාර්තාවට අවම වශයෙන් පහත සඳහන් දෑ ඇතුළත් විය යුතු ය.

- විගණනයේ සොයා ගැනීම් සහ නිරීක්ෂණ
- වංචාව සිදු කළ ආකාරය පිළිබඳ විස්තරාත්මක සටහනක්
- එකතු කරන ලද සාක්ෂිවල සාරාංශ
- අනාගතයේ දී මේ හා සමාන වංචා සිදු වීම වළක්වා ගැනීම සඳහා යෝජනා සහ නිර්දේශ

වෙනත් ආකාරයේ විගණන සමඟ සංසන්දනය කරන විට, වෝහාරික විගණනයේ වැදගත් ම හා සුවිශේෂීභාවය වන්නේ අධිකරණ කටයුතුවලට සහාය දැක්වීමට ඇති හැකියාවයි. එකතු කරන ලද සාක්ෂි සහ සැකකරුවන් හඳුනා ගත් ආකාරය පැහැදිලි කිරීම සඳහා වෝහාරික විගණකවරයා අවශ්‍ය අවස්ථාවල දී අධිකරණ විභාගයට පෙනී සිටිය යුතු ය. සංකීර්ණ ගිණුම්කරණ ගැටලු සහ ගණනය කිරීම් සරල ලෙස ඉදිරිපත් කිරීමට විගණකවරයා සමත් විය යුතු ය. එමගින් නෛතික, ගිණුම්කරණ හෝ විගණන ප්‍රමිතීන් පිළිබඳ එතරම් අවබෝධයක් නොමැති පුද්ගලයින්ට වුව ද වංචාව පිළිබඳ පැහැදිලි ව අවබෝධයක් ලබා දීමට හැකි වේ.

## වත්මන් ලෝකයේ වෝහාරික විගණකගේ කාර්යභාරය

කරුණු කිහිපයක් මත වර්තමාන සන්දර්භය තුළ වෝහාරික විගණක සතු විශේෂඥ දැනුම, විශේෂ කුසලතා සහ නඩු කටයුතු පිළිබඳ ප්‍රාගුණ්‍ය සඳහා වැඩි ඉල්ලුමක් පවතී. ඒ අතුරින් කිහිපයක් පහත දැක්වේ.

- **සංකීර්ණ නඩු සඳහා සහාය වීම**

වර්තමානයේ සිදු වන බොහෝ මූල්‍ය වංචා විමර්ශණය සඳහා නීතිඥයින් සතු දැනුම සහ කුසලතාවන්ටත් වඩා ඉහළ විශේෂිත දැනුමක් හා අවධානයක් අවශ්‍ය වේ. එවැනි තත්ත්වයක දී, සංකීර්ණ මූල්‍ය ගැටලු නිරාකරණය කිරීමෙන් සහ නීතිඥයින්ට සහ ඔවුන්ගේ සේවාදායකයින්ට තේරුම් ගත හැකි

අයුරින් සන්නිවේදනය කරදීම මගින් වෝහාරික විගණකවරුන්ට විශාල සේවාවක් ලබා දිය හැකි ය.

- **රජය විසින් පවත්වන මූල්‍ය පරීක්ෂණ සඳහා**

වෝහාරික ගණකාධිකාරිවරුන්ගේ විමර්ශන හැකියාවන් සාමාන්‍ය සිවිල් ආරවුල්වල දී පමණක් නො ව, රජය මගින් සිදු කරන මහා පරිමාණ මූල්‍ය කටයුතු පිළිබඳ විමර්ශණවල දී ද භාවිත කළ හැකි ය. බදු සම්බන්ධ නඩු, රාජ්‍ය මුදල් අවභාවිතය පිළිබඳ නඩු, මහජන මුදල් අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධ පරීක්ෂණ, කොටස් වෙළෙඳපොළ හැසිරවීම් පිළිබඳ විභාග ආදිය සම්බන්ධයෙන් වෝහාරික විගණන දායකත්වය ලබා ගත හැකි ය.

- **වංචා වැළැක්වීම සහ අවදානම් කළමනාකරණය වැඩිදියුණු කිරීම**

වර්තමානයේ දී විවිධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන වංචා වැළැක්වීමේ පියවර සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වෝහාරික ගිණුම්කරණ විශේෂඥයින්ගෙන් දායකත්වය අපේක්ෂා කරයි. එයට හේතු වන්නේ වංචා සිදු වූ පසු විමර්ශන සහ නඩු පැවරීම් සඳහා වැඩි මුදලක් වැය කරනවාට වඩා පූර්වාරක්ෂක සහ වැළැක්වීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම වාසිදායක වීමයි. අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්හි ඵලදායීතාව තක්සේරු කර ඒවායේ ඇති අඩු පාඩු හඳුනා ගැනීමට මෙවැනි විශේෂඥයින්ට හැකි වේ.

වෝහාරික විගණන වෘත්තීය සිත් ගන්නා සුළු හා ප්‍රතිලාභදායක රැකියාවකි. වැරදිකරුවන් හසු කර ගැනීමට, නඩු කටයුතු නිරාකරණය කිරීමට සහ සිදු විය හැකි මහා පරිමාණ වංචා අවම කිරීමට ඔවුන්ගේ දැනුම, විශේෂඥතාව සහ විමර්ශන කුසලතා ඉවහල් කර ගත හැකි ය.

## ප්‍රසිද්ධියට පත් වෝහාරික විගණන පිළිබඳ තොරතුරු

බොහෝ විට වෝහාරික විගණනය සම්බන්ධ තොරතුරු ප්‍රසිද්ධ මාධ්‍යවලින් සොයා ගැනීම අභියෝගයකි. ඊට හේතු වන්නේ එවැනි පරීක්ෂණ සම්බන්ධ තොරතුරු රහස්‍ය ලෙස තබා ගැනීම ය. කෙසේ වුවත් ප්‍රසිද්ධියට පත් වෝහාරික විගණන පිළිබඳ උදාහරණ කිහිපයක් පහත සඳහන් කරමු.

- **අල් කැපොන් විසින් සිදු කළ බදු වංචාව**

කලින් විස්තර කළ පරිදි, අල් කැපොන් යනු 1920 සහ 1930 ගණන්වල ඇමෙරිකා එක්සත් ජනපදයේ සිටි ප්‍රසිද්ධ අපරාධකරුවකු වූ අතර එෆ්බීඅයිහි (ෆෙඩරල් විමර්ශන කාර්යාංශයෙහි) දක්ෂතම අපරාධ පරීක්ෂකයින්ටවත් ඔහු ව නීතිය හමුවට පැමිණවීම අසීරු විය. කෙසේ වෙතත්, ගණකාධිකාරිවරයකු විසින් වෝහාරික විගණන ක්‍රියාවලියකින් පසු ව ඔහු ව නීතිය හමුවට ගෙන ඒමට සමත් විය.

- **සර් පෝල් මැකාර්ට්නි සහ හෙදර් මිල්ස් දික්කසාදය**

සර් පෝල් මැකාර්ට්නි ප්‍රසිද්ධ ඉංග්‍රීසි ජාතික ගායකයෙකි. ඔහු දික්කසාද වූ විට, ඔහු සතු ව සත්‍ය වශයෙන් ම කොපමණ වත්කමක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ආරවුලක් ඇති විය. තම වත්කම ඩොලර් මිලියන 400ක් පමණ බව ඔහු කියා සිටියේ ය. කෙසේ වෙතත්, ඔහුගේ බිරිඳ හෙදර් මිල්ස්, ඔහුගේ වත්කම ඩොලර් මිලියන 800ක් පමණ වන බව ප්‍රකාශ කළා ය. එම නිසා, ඔහුගේ වත්කම්වල වටිනාකම පරීක්ෂා කිරීම සඳහා ඇය විසින් වෝහාරික විගණකවරුන් කණ්ඩායමක් පත් කරන ලදී. අධිකරණයේ විභාග වූ නඩුවේ දී දුන් තීන්දුව අනුව විනිසුරුවරයා මැකාර්ට්නිගේ වත්කම ඩොලර් මිලියන 450ක් මිස ඩොලර් මිලියන 800ක් නො වන බව සනාථ කළේ ය.

- **රොබට් මැක්ස්වෙල්ගේ අයථා වත්කම් පරිහරණය**

යුරෝපීය ප්‍රකාශකයෙකු වන රොබට් මැක්ස්වෙල් 1991 දී මිය යන තෙක් වසර ගණනාවක් පුරාවට කොටස් හිමියන්ගේ සහ සේවාදායකයින්ගේ මුදල් අයථා ලෙස පරිහරණය කර ඇත. ඔහුගේ අභාවයත් සමඟ ම වංචනික ලෙස සපයා ගත් මුදල් සහ ණය මත ගොඩ නගා තිබූ ඔහුගේ ව්‍යාපාරය බංකොලොත්භාවයට පත් විය. වෝහාරික විගණකවරුන් කණ්ඩායමක් වසර 14ක් පුරා සිදු කළ පරීක්ෂණවලට අනුව මැක්ස්වෙල් විසින් දළ වශයෙන් එක්සත් ජනපද ඩොලර් බිලියනයක් අයථා ලෙස පරිහරණය කර ඇති බව අනාවරණය විය.

- **එන්රොන් වංචාව**

එන්රොන් වංචාව ඉතිහාසයේ වඩාත් ම ප්‍රසිද්ධ සුරැකුම්පත් වංචාව විය හැකි ය. 1980 දශකයේ මැද භාගයේ සිට 2001 දක්වා කාලය තුළ එන්රොන්හි ගිණුම් අංශය

එහි විධායක නිලධාරීන් සමඟ එක් ව "විශේෂ අරමුණු සහිත ආයතන" (Special Purpose Entities - SPE) නිර්මාණය කිරීම මගින් අසාර්ථක වූ ව්‍යාපෘතිවලින් ලද ඩොලර් මිලියන ගණනක පාඩු සැඟවීමට සමත් විය. වසරක් තුළ සමාගමේ කොටසක වටිනාකම ඩොලර් 90 සිට ඩොලර් 1 දක්වා පහත වැටීමට ලක්වූ අතර ඊට හේතු සෙවීම සඳහා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව පරීක්ෂණයක් ආරම්භ කළේ ය. සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වෝහාරික ගණකාධිකාරීවරුන් විසින් එන්රොන්හි මූල්‍ය ප්‍රකාශන හොඳින් පරීක්ෂා කර බැලීමෙන් පසු ව, එන්රොන් විසින් භාවිත කළ නිර්මාණාත්මක ගිණුම්කරණ ක්‍රම ගණනාවක් සොයා ගන්නා ලදී. මෙම නිර්මාණාත්මක ගිණුම්කරණ ශිල්පීය ක්‍රම අතර වගකීම් සැඟවීම, කොටස් මිල ගණන් වැඩියෙන් පෙන්වීම සහ මූල්‍ය වාර්තා ව්‍යාජ ලෙස වෙනස් කිරීම සිදු කර තිබුණි.

- **වර්ල්ඩ්කොම් වංචාව**

වර්ල්ඩ්කොම් යනු 1990 දශකය තුළ ඉතා ඉහළ ප්‍රගතියක් සහ වර්ධනයක් පෙන්නුම් කළ විදුලි සංදේශ සමාගමකි. විදුලි සංදේශ කර්මාන්තයේ පරිහානියත්, ඇතැම් යෝජිත ඒකාබද්ධ කිරීම් අසාර්ථක වීමත් හේතුවෙන්, 2000 දශකයේ දී සමාගමේ තත්ත්වය නරක අතට හැරුණි. තත්ත්වය තවදුරටත් පිරිහීයත් ම එදිනෙදා කොටස් මිල පවත්වා ගැනීම සඳහා කළමනාකාරිත්වය විසින් ඉපැයීම් අඩු වීම වසං කිරීමේ උත්සාහයක් ලෙස වංචනික ගිණුම්කරණ ක්‍රම භාවිතයට යොමු විය. කෙසේ වෙතත් මෙය විගණකවරුන්ගේ නිරීක්ෂණයට ලක්විය. ඩොලර් බිලියන 3.8කට වැඩි වටිනාකමක් සඳහා සමාගමේ කළමනාකාරිත්වය විසින් වංචනික සටහන් ඉදිරිපත් කර ඇති බව පසු ව විගණකවරුන් විසින් නිරීක්ෂණය කරන ලදී. මෙම වංචනික සටහන් අතර, ප්‍රාග්ධන වියදම් ලෙස පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීම සහ ආදායම ව්‍යාජ ඉහළ නංවා පෙන්වීම ඇතුළත් විය.

- **ඇමරිකන් ඉන්ටර්නැෂනල් ගෘප් (AIG) Inc - ඒඅයිජී මූලස්ථාන වංචාව**

මෙම වංචාව සිදු වූයේ 2000 දෙසැම්බර් සිට 2001 මාර්තු දක්වා කාලය අතර තුළ ය. ව්‍යාජ ප්‍රතිරක්ෂණ ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම සඳහා 2000 දෙසැම්බර් මාසයේ දී ඒ.අයි.ජී. සමාගම ජෙන් රී කෝපරේෂන් නම් තවත් සමාගමක් සමඟ වංචනික ගනුදෙනුවලට එළැඹුනි. අවසානයේ දී, වෝහාරික විගණකවරුන් විසින් කරන ලද පරීක්ෂණ මාලාවක් මත පදනම් ව ඒ.අයි.ජී. සමාගම ගිණුම් වංචාවන්ට වැරදිකරු බවට අනාවරණය විය.

## ශ්‍රී ලංකාවේ වෝහාරික විගණන ක්ෂේත්‍රය

වෝහාරික විගණන වෘත්තිය සාපේක්ෂ ව ශ්‍රී ලංකාවට නව ක්ෂේත්‍රයක් වන අතර ඒ පිළිබඳ ව විශේෂඥතාවන් හා කුසලතාවන් ක්‍රමයෙන් වර්ධනය කර ගත යුතු ව ඇත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මෙම ක්ෂේත්‍රයේ ප්‍රවීණත්වය හා කුසලතා වර්ධනය කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරමින් සිටී. එම ආයතනය මේ සම්බන්ධයෙන්, සහතිකපත්‍ර පාඨමාලා ගණනාවක් හඳුන්වා දී ඇති අතර පුහුණු සැසි ද පවත්වයි. ඇතැම් ගිණුම්කරණ සමාගම් ද තම ආයතන තුළ වෝහාරික විගණන ඒකක පිහිටුවීමට කටයුතු කර ඇත. මීට අමතර ව, විගණකාධිපති දෙපාර්තමේන්තුව ද ඔවුන්ගේ විෂය පථය තුළ වෝහාරික විගණන සිදු කිරීමට යම් යම් පියවරයන් ගනිමින් සිටී.

**ආශ්‍රිත ලිපි සහ ග්‍රන්ථ**


- http://www.forensicglobal.org
- https://www.investopedia.com
- https://www.affluentcpa.com
- http://public-information.xaviermedia.com
- https://accounting.fau.edu/blog/forensic-accounting
- https://opinionfront.com/biggest-accounting-scandals-of-all-time
- "A History of Forensic Accounting" (2014), Kristen Dreyer, Grand Valley State University

# සාම්ප්‍රදායික නොවන මුදල් ප්‍රතිපත්තිය

**එරන්දි ලියනගේ**
**නියෝජ්‍ය ලේකම්**
**ලේකම් දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

ලෝකයේ මහ බැංකු සිය මුදල් ප්‍රතිපත්තිය හරහා මිල ස්ථායිතාව පවත්වා ගැනීමට ක්‍රියා කරන අතර එතුළින් තිරසාර ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමට සහාය දක්වයි. උද්ධමනය අඩු අගයක පවත්වා ගනිමින් එහි විචලතා අවම මට්ටමක පවත්වා ගෙන යෑම මිල ස්ථායිතාව ලෙස හැඳින්වේ. මිල ස්ථායිතාව පවත්වා ගැනීම මගින් මූල්‍ය ස්ථායිතාව පවත්වා ගැනීමටත් සහය වේ. මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී ලෝකයේ බොහොමයක් මහ බැංකු විසින් මෙහෙයුම් ඉලක්ක ලෙස කෙටිකාලීන පොලී අනුපාතික යොදා ගන්නා අතර විවට වෙළෙඳපොළ කටයුතු හරහා මුදල් සැපයුම පාලනය කරනු ලබයි. 2007 - 2009 කාල පරිච්ඡේදයේ දී පැන නැගුණ ගෝලීය මූල්‍ය අර්බුදයත් සමඟ බොහෝ සංවර්ධිත රටවල කෙටිකාලීන පොලී අනුපාතික ශුන්‍ය සීමාව දක්වා අඩු කරන ලද අතර, මහ බැංකුවලට සිය මිල ස්ථායිතා අරමුණු ළඟා කර ගැනීම සඳහා තවදුරටත් පොලී අනුපාතික හරහා මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාණවත් නො වන බව වැටහුණි. ඒ සමඟ ම මෙම සාම්ප්‍රදායික ක්‍රමය වෙනුවට සාම්ප්‍රදායික නො වන මුදල් ප්‍රතිපත්තිය යන සංකල්පය මහ බැංකු අතර ජනප්‍රිය විය.

## සාම්ප්‍රදායික මුදල් ප්‍රතිපත්තිය

මහ බැංකුවක මුදල් ප්‍රතිපත්තිය, ආර්ථිකයේ මිල ස්ථායිතාව පවත්වා ගෙන යෑම තහවුරු කිරීම සඳහා භාවිත කරන අතර, බොහෝ විට එය හැසිරවීමේ උපකරණය වනුයේ කෙටිකාලීන පොලී අනුපාතිකයි. මෙහි දී වඩාත් ජනප්‍රිය න්‍යාය වනුයේ ටේලර් රීතියයි. එනම් අපේක්ෂිත උද්ධමනය සහ ආර්ථික වර්ධනය වෙනස් වීම අනුව මහ බැංකුව සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික වෙනස් කිරීමයි. කෙටිකාලීන පොලී අනුපාතික මගින් මුදල් වෙළෙඳපොළ පිළිබඳ ව සංඥා ලබා දෙන අතර, එහි ප්‍රතිඵල විවිධ ක්‍රම හරහා සමස්ත ආර්ථිකය වෙත ම සම්ප්‍රේෂණය වේ. මහ බැංකු මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී මෙහෙයුම් ඉලක්කය ලෙස පොලී අනුපාතික භාවිත කිරීමට වැඩි කැමැත්තක් දක්වනුයේ එය නිරීක්ෂණය කිරීමට මෙන් ම පාලනයට ද වඩාත් පහසු බැවිනි.

කෙසේ වුව ද, 2007 වසරේ දී ආරම්භ වුණු ගෝලීය මූල්‍ය අස්ථාවර බව මුදල් වෙළෙඳපොළ කෙරෙහි ද බලපෑ අතර එය වඩාත් බලපෑමට ලක් වූයේ 2008 වසරේ දී ලේමන් බ්‍රදර්ස් ආයතනය කඩා වැටීමෙන් ගෝලීය මූල්‍ය අර්බුදය නිර්මාණය වීමෙන් පසු ව ය. ගෝලීය මූල්‍ය අර්බුදය මූල්‍ය පද්ධති ස්ථායිතාවට බාධා කරමින් මූල්‍ය පද්ධතිය තුළ අර්බුදයක් ඇති කළා පමණක් නො ව දියුණු සහ දියුණු වෙමින් පවතින රටවල ආර්ථික වර්ධනය සැලකිය යුතු ලෙස මන්දගාමී වීමට හේතු වූ අතර, එම රටවල මිල ස්ථායිතාව කෙරෙහි ද බලපෑවේ ය. එනම් ආර්ථික අවපාතයත් සමඟ එම ආර්ථිකවල මිල ස්ථායිතාව බිඳ වැටුණු අතර භාණ්ඩ සහ සේවාවල පොදු මිල මට්ටම අඛණ්ඩ ව පහළ වැටුණි. ගෝලීය මූල්‍ය අර්බුදයට ලක් වූ මහ බැංකු සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික ශුන්‍ය සීමාව දක්වා පහත හෙළමින් අර්බුදයට ප්‍රතිචාර දැක්වීය. කෙසේ වුව ද, මෙම ක්‍රියාමාර්ගය එම රටවල මිල ස්ථායිතාව පවත්වා ගෙන යෑමට සහ ආර්ථිකය යළි නගා සිටුවීමට ප්‍රමාණවත් නො වූ අතර, වෙනත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වෙත යොමු වීමේ අවශ්‍යතාව මතු කර දැක්වීය. එහි ප්‍රතිඵලයක් ලෙස සාම්ප්‍රදායික නො වන මුදල් ප්‍රතිපත්තිය කෙරේ මහ බැංකු යොමු විය.

## සාම්ප්‍රදායික මුදල් ප්‍රතිපත්තියෙන් සාම්ප්‍රදායික නො වන මුදල් ප්‍රතිපත්තිය වෙත

ගෝලීය මූල්‍ය අර්බුදයත් සමග මහ බැංකුවල අරමුණු සාක්ෂාත් කර ගැනීමට සාම්ප්‍රදායික මුදල් ප්‍රතිපත්තිය ප්‍රමාණවත් නො වන බව පැහැදිලි වූ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු දෙකක් දැක්විය හැකි ය. පළමු ව, එකල පැවති ආර්ථික කම්පන හමුවේ නාමික පොලී අනුපාතික ශුන්‍ය කරා ගෙන යෑම අවශ්‍ය වුව ද, එම පොලී අනුපාතික ශුන්‍යයට වඩා පහළ අගයකට ගෙන යෑම ප්‍රායෝගික නො වී ය. එවැනි තත්ත්වයක් තුළ තවදුරටත් ප්‍රතිපත්ති පොලී අනුපාතික පහළ දැමීම කළ නො හැකි බැවින්, වෙනත් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයක අවශ්‍යතාව පැන නැගුණි. දෙවනුව, මුදල් සම්ප්‍රේෂණ ක්‍රියාවලිය සැලකිය යුතු ලෙස දුර්වල මට්ටමක පවතී නම් පොලී අනුපාතික ශුන්‍යයට ඉහළ මට්ටමක පවතින අවස්ථාවක වුව ද සාම්ප්‍රදායික නො වන මුදල් ප්‍රතිපත්තිය වඩාත් යෝග්‍ය වේ.

සාමාන්‍යයෙන් සාම්ප්‍රදායික නො වන ක්‍රියාමාර්ග යනු කුටුම්භ, බැංකු සහ මූල්‍ය නො වන ආයතන සඳහා පවතින බාහිර මූල්‍ය පහසුකම් සහ එහි පිරිවැය සෘජු ව ම ඉලක්ක කර ගනිමින් ගනු ලබන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ලෙස හැඳින්විය හැකි ය. මෙම මූල්‍යන කටයුතු සඳහා පවතින මූලාශ්‍ර මහ බැංකුවේ ද්‍රවශීලතාව, ණය, ස්ථාවර ආදායම් ලබා දෙන සුරැකුම්පත් හෝ හිමිකම් වශයෙන් පවතී.

සාම්ප්‍රදායික නො වන මුදල් ප්‍රතිපත්ති උපකරණ විවිධ ලෙස අර්ථ දැක්විය හැකි අතර, Bernake සහ Reinhart (2004) විසින් එය ප්‍රධාන කාණ්ඩ තුනක් යටතේ වර්ග කර ඇත.

i ආයෝජකයන් විසින් වර්තමානයේ අපේක්ෂා කරන මට්ටමට වඩා අඩු මට්ටමක අනාගතයේ දී කෙටිකාලීන පොලී අනුපාතික පවතින බවට සහතික කිරීම (බැඳීම් ප්‍රතිවිපාකය - Commitment Effect)

ii කෙටිකාලීන ප්‍රතිපත්ති පොලී අනුපාතික ශුන්‍ය අගයේ පවත්වා ගැනීමට අවශ්‍ය ප්‍රමාණයට වඩා ඉහළ අගයකින් මහ බැංකුවේ ශේෂ පත්‍රයේ ප්‍රමාණය ඉහළ නැංවීම (ප්‍රමාණාත්මක ලිහිල්කරණය - Quantitative Easing)

iii මහ බැංකුවේ ශේෂ පත්‍රයේ සංයුතිය වෙනස් කරමින් වෙළෙඳපොළ සුරැකුම්පත් සැපයීම සාපේක්ෂ වශයෙන් වෙනස් කිරීම (ගුණාත්මක ලිහිල්කරණය හෝ ණය ලිහිල්කරණය - Qualitative Easing or Credit Easing)

### බැඳීම් ප්‍රතිවිපාකය

මහ බැංකු ඉතා කෙටිකාලීන පොලී අනුපාතික (සාමාන්‍යයෙන් එක් දින අන්තර් බැංකු පොලී අනුපාතික) ශුන්‍ය මට්ටමක පවත්වා ගනු ලැබුව ද අනාගත මුදල් ප්‍රතිපත්තියෙහි වෙනස්වීම් පිළිබඳ ව වෙළෙඳපොළේ විශාල අවිනිශ්චිතතාවක් පවතී. එබැවින්, අනාගත මුදල් ප්‍රතිපත්ති පොලී අනුපාතික මට්ටම පිළිබඳ ව කොන්දේසි සහිත ව හෝ රහිත ව පූර්ව බැඳීමකට පැමිණීම බැඳීම් ප්‍රතිවිපාකය නැතහොත් ඉදිරි මාර්ගෝපදේශය (Forward Guidance) ලෙස හැඳින්වේ. වෙළෙඳපොළ අපේක්ෂා කරන මට්ටමට වඩා පහළ මට්ටමක පොලී අනුපාතික පවත්වා ගෙන යන බවට මහ බැංකුව සහතික කරන්නේ නම් එය වෙළෙඳපොළ දිගු කාලීන පොලී අනුපාතික පහළ දැමීමට හේතු විය හැකි අතර, එය ආයෝජකයින් අතර පවතින අවිනිශ්චිතතා ඉවත් කිරීමට සහය වෙමින් ආර්ථික වර්ධනයට රුකුලක් වේ.


### ප්‍රමාණාත්මක ලිහිල්කරණය

ප්‍රමාණාත්මක ලිහිල්කරණයේ දී මහ බැංකුව සිය ශේෂ පත්‍රයේ ප්‍රමාණය පුළුල් කරයි. එහි දී කුමන ආකාරයේ වත්කම් මිලදී ගත යුතු ද යන්න තීරණය කළ යුතු ය. න්‍යායාත්මක ව ඕනෑ ම ආකාරයක වත්කම් මිලදී ගත හැකි වුව ද සාමාන්‍යයෙන් ප්‍රමාණාත්මක ලිහිල්කරණයේ දී බැංකු මගින් දිගුකාලීන රාජ්‍ය බැඳුම්කර මිලදී ගැනීම කෙරෙහි අවධානය යොමු කරයි. 2001 වසරේ දී ජපාන මහ බැංකුව විසින් ජපාන රජයේ බැඳුම්කර මිලදී ගැනීම ආරම්භ කිරීමත් සමග එය විශාල ලෙස ප්‍රමාණාත්මක ලිහිල්කරණය සිදු කළ ප්‍රථම නවීන මහ බැංකුව බවට පත් විය. 2008 අවසාන භාගයේ දී ඇමෙරිකා එක්සත් ජනපදයේ ආර්ථික හා මූල්‍ය තත්ත්වයන් දැඩි ලෙස පිරිහීමට ලක්වීමත් සමඟ ෆෙඩරල් සංචිත අනුපාතික ඉලක්කය ශුන්‍යයට ආසන්න අගයක් දක්වා අඩු කළ ද තත්ත්වය දරුණු වීම හමුවේ ප්‍රමාණාත්මක ලිහිල්කරණ ක්‍රියාමාර්ග වෙත යොමු විය. එම ක්‍රියාමාර්ග අතර මහා පරිමාණයෙන් භාණ්ඩාගාර සුරැකුම්පත් ආදී වත්කම් මිලදී ගැනීම ඇතුළත් විය. ෆෙඩරල් සංචිත බැංකුව 1930 දශකයේ දී ද ප්‍රමාණාත්මක ලිහිල්කරණ ක්‍රියාමාර්ග අනුගමනය

කර තිබේ. ප්‍රමාණාත්මක ලිහිල්කරණය කෙරෙහි පවතින න්‍යායාත්මක විවේචනය වන්නේ ශුන්‍ය පොලී අනුපාතික තත්ත්වයක් යටතේ මුදල් සහ කෙටිකාලීන වාණිජ පත්‍රිකා පූර්ණ ආදේශක වන බැවින් ජංගම ගිණුමේ ශේෂ මත සිදු කරන වෙනස්කම් වත්කම් රඳවා ගැනීමෙහි විතැන්වීමක් පමණක් නිරූපණය කරමින් මූර්ත ආර්ථික බලපෑමක් සිදු නො කරන බවයි.

එසේ ම, සාමාන්‍ය මුදල් සම්ප්‍රේෂණ යාන්ත්‍රණය බිඳ වැටී ඇති අවස්ථාවක වෙළෙඳපොළ ක්‍රියාකාරීන්ට සෘජු ව ම ණය මුදල් ලබා දීම ද ගුණාත්මක ලිහිල්කරණයක් ලෙස දැක්විය හැකි ය. මෙහි දී ණය වෙළෙඳපොළ පොලී අනුපාතික පරතරය අඩු කිරීම අරමුණු කොට ගෙන ප්‍රතිපත්ති ක්‍රියාවට නංවන අතර, පෞද්ගලික ණය වෙළෙඳපොළ කටයුතු වර්ධනය කිරීමට උපකාරී

**රූපසටහන 1: ෆෙඩරල් සංචිත බැංකුවේ ශේෂ පත්‍රය**




## ගුණාත්මක ලිහිල්කරණය

ගුණාත්මක ලිහිල්කරණය යනු මහ බැංකුව සතු වත්කම්වල සංයුතිය වෙනස් කිරීම අරමුණු කර ගනිමින් ගනු ලබන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන් ය. මෙහි මූලික අදහස නම් පෞද්ගලික අංශය සතු විවිධ වත්කම් වර්ගවල සංයුතිය වෙනස් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග මගින් එම වත්කම්වල සාපේක්ෂ මිල ගණන් වෙනස් වන අතර, එය මූර්ත ආර්ථික කටයුතුවලට බලපෑමක් ඇති කිරීමයි. නිදසුනක් ලෙස මහ බැංකුව දිගුකාලීන රාජ්‍ය බැඳුම්කර මිලදී ගැනීම් (Outright Purchases) ඉහළ දැමීම සිදු කළහොත් එමගින් දිගුකාලීන බැඳුම්කර එලදා අඩු වීමක් අපේක්ෂා කළ හැකි අතර, ආර්ථිකයට සහනයක් සලසයි. ෆෙඩරල් සංචිත බැංකුවේ 'කල්පිරීම දීර්ඝ කිරීමේ වැඩසටහන' (Maturity Extension Programme) සහ යුරෝපා මහ බැංකුවේ 'සුරැකුම්පත් වෙළෙඳපොළ වැඩසටහන' (Security Market Programme) ගුණාත්මක ලිහිල්කරණය සඳහා නිදසුන් ලෙස දැක්විය හැකි ය. එසේ ම, ජපාන මහ බැංකුව වසර 10ක කල්පිරීමක් සහිත භාණ්ඩාගාර බැඳුම්කරවල එලදා අනුපාතය ශුන්‍ය කර තබා ගැනීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළේ ය.

වේ. කෙසේ වුව ද, පෞද්ගලික ව නිකුත් කරන සුරැකුම්පත් මිලදී ගැනීම කර්මාන්තවලට හෝ ආයතනවලට බලපෑමක් නො වන අයුරින් මනා ලෙස සැලසුම් කළ යුතු ය.

## සාම්ප්‍රදායික නො වන මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ ව විවිධ රටවල අත්දැකීම්

2007 වසරේ ආරම්භ වූ ගෝලීය මූල්‍ය අර්බුදය සමග බොහෝ රටවල සාම්ප්‍රදායික නො වන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගය දෙසට යොමු විය. යුරෝපා මහ බැංකුව, එංගලන්ත මහ බැංකුව සහ ජපාන මහ බැංකුව වැනි බොහෝ බැංකු විශාල ලෙස රජයේ සහ සාංගමික බැඳුම්කර මිලදී ගත් අතර ද්‍රවශීලතාව ඉහළ නැංවීම සඳහා විදේශ විනිමය වෙළෙඳපොළ වෙත ද මැදිහත් විය. එසේ ම, එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව ණය ලිහිල්කරණ ක්‍රියාමාර්ග හරහා සිය ශේෂ පත්‍රය සැලකිය යුතු මට්ටමකින් ප්‍රසාරණය කළේ ය.

විවිධ මහ බැංකු විසින් ගෝලීය මූල්‍ය අර්බුද සමයේ අනුගමනය කළ ගුණාත්මක ලිහිල්කරණ ක්‍රියාමාර්ග සංඛ්‍යා සටහන 1 මගින් දැක්වේ.

සියලු ම බැංකු සුවිශේෂී දිගුකාලීන මෙහෙයුම් කටයුතු, සුදුසුකම් සහිත ඇපකර පුළුල් කිරීම සහ අන්තර් මහ බැංකු විදේශ විනිමය හුවමාරුව සිදු කර ඇති බව මෙම සංඛ්‍යා සටහන මගින් පෙනී යයි.

## සාම්ප්‍රදායික නො වන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් ආර්ථිකයට වන බලපෑම

සාම්ප්‍රදායික නො වන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් ආර්ථිකයට සෘජු ව ම බලපෑම් ඇති කරනු ඇතැයි සැලකෙන අතර, එය ප්‍රධාන සම්ප්‍රේෂණ මාර්ග හතරක් යටතේ දැක්විය හැකි ය. පළමුව රාජ්‍ය හා පෞද්ගලික බැඳුම්කර විශාල ප්‍රමාණයක් මිලදී ගැනීම සහ විවිට වෙළෙඳපොළ කටයුතු වෙනුවට බැඳීම් වශයෙන් වත්කම් භාර ගැනීම ඉහළ නැංවීම මගින් ඉලක්කගත වෙළෙඳපොළ ගනුදෙනු සඳහා පවතින බාධා ඉවත් කළ යුතු අතර, එය අවදානම් වාරික අඩු කිරීමට හේතු විය හැක. මූල්‍ය අර්බුද උච්චතම අවධියේ අවදානම් වාරික තියුණු ලෙස ඉහළ ගිය අතර, ආයෝජකයන්ට වත්කම් නැවත විකිණීමට නො හැකි වීමේ අවදානම හේතුවෙන් වත්කම් අත්පත් කර ගැනීමට මැලි බවක් දැක්විය (ද්‍රවශීලතා ප්‍රතිවිපාකය). එසේ ම සාම්ප්‍රදායික නො වන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් ආයෝජකයන්ගේ වත්කම් කළඹ නැවත සකස් කිරීම ද අපේක්ෂා කෙරේ.

අවදානම් සහිත වත්කම් විශාල ප්‍රමාණයක් මහ බැංකු විසින් මිලදී ගැනීම මගින් එම වත්කම්වල


**සංඛ්‍යා සටහන 1: ගුණාත්මක ලිහිල්කරණ ක්‍රියාමාර්ග**

| අරමුණ | ක්‍රියාමාර්ගය | ෆෙඩරල් සංචිත බැංකුව | යුරෝපා මහ බැංකුව | එංගලන්ත මහ බැංකුව | ජපාන මහ බැංකුව | කැනඩා මහ බැංකුව | ඕස්ට්‍රේලියානු සංචිත බැංකුව | ස්වීඩන් ජාතික බැංකුව |
|---|---|---|---|---|---|---|---|---|
| තොග අන්තර් බැංකු වෙළඳපොළ තත්ත්වයන් වෙත මැදිහත් වීම | වට්ටම් කවුළු පහසුකම නවීකරණය කිරීම | X | | X | | | | |
| | සුවිශේෂී දිගුකාලීන මෙහෙයුම් කටයුතු | X | X | X | X | X | X | X |
| | සුදුසුකම් සහිත ඇපකර පුළුල් කිරීම | X | X | X | X | X | X | X |
| | ප්‍රතිපාර්ශ්ව පුළුල් කිරීම | X | | X | X | X | X | |
| | අන්තර් මහ බැංකු විදේශ විනිමය හුවමාරුව | X | X | X | X | X | X | X |
| ණය වෙළඳපොළ වෙත මැදිහත්වීම | වාණිජ පත්‍ර අරමුදල්/මිලදී ගැනීම/ඇපකර සුදුසුකම් | X | | X | X | X | | |
| | වත්කම් මත සුරැකුම්පත් අරමුදල්/ මිලදී ගැනීම්/ඇපකර සුදුසුකම් | X | | X | X | X | X | |
| පුළුල් මූල්‍ය තත්ත්වයන් වෙත මැදිහත්වීම | සාංගමික බැඳුම්කර අරමුදල්/මිලදී ගැනීම්/ඇපකර සුදුසුකම් | | | X | X | X | | X |
| | රාජ්‍ය අංශයේ සුරැකුම්පත් මිලදී ගැනීම | X | | X | X | | | |
| | අනෙකුත් රාජ්‍ය නොවන අංශයේ සුරැකුම්පත් මිලදී ගැනීම | | | | X | | | X |

මූලය : ආසියානු සංවර්ධන බැංකු ආයතනය

මිල ඉහළ යන අතර ඵලදායිතා අනුපාතිකය අඩු වේ. එමගින් සුරැකුම්පත් නැවත නිකුත් කිරීම සඳහා අවශ්‍ය පොලී අනුපාතික මට්ටම අඩු විය හැකි අතර, ඒ අනුව ආයෝජකයින් පවතින අනෙකුත් වත්කම් වෙත යොමුවීමට ධෛර්යයවත් කෙරේ. වත්කම් මිලදී ගැනීම අතරතුර ද්‍රවශීලතාව සැපයීම මගින් බැංකු නො වන මූල්‍ය ආයතන වෙත ණය ප්‍රධානය කිරීමට බැංකු ධෛර්යවත් කළ යුතු ය. මහ බැංකු විසින් දිගු කාලයක් පුරා ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු මට්ටමක පවත්වා ගෙන යෑමට වග වන විට පොලී අනුපාතික අවදානම ද අඩු වේ (කාල බලපෑම). අවසානයේ දී මෙම සාම්ප්‍රදායික නො වන ක්‍රියාමාර්ග තුළින් විශ්වසනීයත්වය නැවත තහවුරු කළ යුතු ය. මෙසේ වත්කම් මිලදී ගැනීම තුළින් මහ බැංකු ආයෝජකයින් සහතික කරන අතර, ඔවුන් ව එසේ කිරීමට පොළඹවයි (සංඥා ප්‍රතිවිපාකය). කාල සහ සංඥා ප්‍රතිවිපාක මගින් අවදානම් වාරික අඩු කළ යුතු වේ. එවිට මූල්‍යන පිරිවැය අඩු වීමෙන් මෙම ක්‍රියාමාර්ග තුළින් ආර්ථිකයේ සමාහාර ඉල්ලුම ඉහළ නංවනු ඇති අතර, උද්ධමන අනුපාතය සාමාන්‍ය මට්ටම කරා ළඟා වනු ඇත.

**රූප සටහන 2: සාම්ප්‍රදායික නොවන මුදල් ප්‍රතිපත්තියේ ඍජු බලපෑම**




## සාරාංශය

2007 කාල පරිච්ඡේදයේ දී ආරම්භ වූ ගෝලීය මූල්‍ය අර්බුදය සමග ඇතැම් රටවල කෙටිකාලීන පොලී අනුපාතික ශූන්‍ය සීමාව දක්වා අඩු කිරීමට සිදු වූ අතර එහි දී සාම්ප්‍රදායික මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාණවත් නො වුණි. එහි දී සාම්ප්‍රදායික නො වන මුදල් ප්‍රතිපත්තිය යොදා ගනිමින් බොහෝ මහ බැංකු විසින් සිය අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කරන ලද අතර එතුළින් බොහෝ රටවලට තම ආර්ථික යථා තත්ත්වයට පත් කර ගැනීමට හැකියාව ලැබුණි.

## මූලාශ්‍ර


Berhanke, B. S. and Reinhart, V. R. (2004), Conducting Monetary Policy at Very Low Short-Term Interest, AEA Papers and Proceedings, Vol 94, No 2

Morgan, P. (2009), The Role and Effectiveness of Unconventional Monetary Policy, ADBI Working Paper 163, Asian Development Bank Institute, Tokyo

https://www.stlouisfed.org/~/media/Publications/Regional-Economist/Image-Issues/January-2014/fig2_balancesheetL.png?la=en

# විදේශීය සංචාරකයින් ගෙදර වගේ නවතින
# නිවෙස් නවාතැන් (Home Stay)

**මිගාර සම්පත් හඳුන්ගේ**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ**
**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

**සුමුදු ගුණරත්න**
**ජ්‍යේෂ්ඨ කළමනාකරු**
**ප්‍රාදේශීය කාර්යාලය - මාතර**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

ලොව බොහෝ රටවල් ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස සංචාරක කර්මාන්තය කෙරෙහි ආකර්ෂණය දක්වනු දැක ගත හැකි ය. ඒ අනුව, විවිධ රටවල පවත්නා තත්ත්වයන් පදනම් කර ගනිමින් සංචාරක කර්මාන්තයේ විවිධ උප අංග බිහිවීමක් සිදු වී ඇති බව පෙනේ. පහත දැක්වෙන්නේ එවැනි උප අංග කිහිපයකි.

1. නවාතැන් (Accommodation)
2. වික්‍රමාන්විත සංචාරක ව්‍යාපාරය සහ විනෝදය (Adventure Tourism) Recreation)
3. ආකර්ෂණීය ස්ථාන (Attractions)
4. වැඩසටහන් සහ සම්මන්ත්‍රණ (Events & Conferences)
5. ආහාරපාන වර්ග (Food & Beverage)
6. සංචාරක සේවා (Tourism Services)
7. ප්‍රවාහන (Transportation)
8. සංචාරක වෙළෙඳාම් (Travel Trade)
9. ප්‍රජා පාදක සංචාරක කර්මාන්ත (Community Based Tourism)

විශේෂයෙන් ම, දියුණු වෙමින් පවතින රටවල සංවර්ධන ඉලක්කගත ඒකකයක් ලෙස ප්‍රජාව පාදක කර ගත් සංචාරක කර්මාන්ත හඳුනා ගෙන ඇත. ආදායම වැඩි කර ගැනීමේ ඉලක්කයකින් යුත් මෙම උප අංගයේ මූලික අරමුණ වන්නේ ග්‍රාමීය ප්‍රදේශවල සිටින මෙම ජනතාව සංචාරක කර්මාන්තය වෙත යොමු කිරීම මගින් එම සංචාරකයන්ට නවාතැන් පහසුකම් දීමට හැකි වීම තුළ ඔවුන්ට ආදායමක් ලබා ගැනීමයි. මෙය ප්‍රාදේශීය වශයෙන් පුද්ගල සංවර්ධනයට ඉවහල් වේ. අම්රන් 2009 දී දක්වා ඇති පරිදි සංචාරක සම්පත් කළමනාකරණය කිරීම සඳහා දේශීය ප්‍රජාවගේ හැකියාව වැඩිදියුණු වීම මෙ මගින් සිදු වේ.

## නිවෙස් නවාතැන් වැඩසටහනේ ඉතිහාසය හා නිර්වචනය

මූලික වශයෙන් මෙම නිවෙස් නවාතැන් ක්‍රමය (Home Stay) ආරම්භ වූයේ 1970 වර්ෂයේ අග භාගයේ දී යුරෝපා කලාපය තුළයි. සංචාරකයන් සඳහා නිවෙස්වල නවාතැන්දීමේ ක්‍රමය රටකින් රටකට වෙනස් වන බැවින් මෙම සංකල්පය සඳහා වෙන් වූ ගෝලීය අර්ථකථනයක් නොමැත. මෙම සංකල්පයට විවිධ නම් භාවිත කරනු ලබන අතර 'සංස්කෘතික නැවතුම්' (Culture Stay), 'සත්කාරක පවුල්' (Host Families), 'ගොවිපලෙහි නවාතැන්' (Farm Stay), 'ඇඳ සහ උදය ආහාර' (Bed & Breakfast), 'කුඩා හෝටල්' (Small Hotels) යනාදිය සංචාරකයන් අතර ප්‍රසිද්ධ භාවිත වේ.

නිවෙස් නවාතැන් සංකල්පයෙන් අදහස් වන්නේ යම් සංචාරකයෙක් විසින් තෝරා ගන්නා ලද යම් ප්‍රදේශයක ජීවත් වන්නා වූ සත්කාරක පවුලක් සමඟ ඔවුන්ගේ සංස්කෘතික ජීවන රටාවන් ද ඇතුළත් වූ දෛනික කටයුතු හා සම්බන්ධ වෙමින් අත්දැකීම් ලබා ගැනීමයි.

ඒ අනුව, විදෙස් සංචාරකයින් අවට ප්‍රජාව සමඟ සෘජු ව ම සම්බන්ධ වීම තුළ ඔවුන්ගේ දෛනික කටයුතු සඳහා සම්බන්ධ වනවා මෙන් ම දැනුම, සංස්කෘතික ලක්ෂණ, අත්දැකීම් හුවමාරු කර ගැනීමට ද මහත් සේ ඉවහල් වනු ඇත. විදේශීය සංචාරකයන් බොහෝ විට මෙම නිවෙස් නවාතැන් ක්‍රමය සඳහා යොමු වන්නේ ග්‍රාමීය වාතාවරණය සහ එහි ජනතාවගේ ජීවන රටාව පිළිබඳ ව අත්දැකීම් ලබා ගැනීමේ කැමැත්තෙනි. එසේ ම, වෙනත් සංස්කෘතීන් පිළිබඳ අධ්‍යයනය කිරීම, වෙනත් භාෂාවන් අධ්‍යයනය කිරීම වැනි කටයුතු සඳහා ද නිවෙස් නවාතැන් සංකල්පය යොදා ගනී.

## ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය

ශ්‍රී ලංකාව සංචාරකයන් අතර වඩාත් ආකර්ෂණීය රටකි. රට වටේ විහිදුණු මුහුද සහ වෙරළ තීරය, ස්වභාව සෞන්දර්යය, රක්ෂිත හා ලෝක උරුම වනාන්තර, ලෝක උරුම ඓතිහාසික ස්ථාන සංචාරකයන් අමන්දානන්දයට පත් කරයි. කෙසේ වුව ද, විකල්ප නවීන සංචාරක සංකල්පවලට ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය නැඹුරුවීමේ හැකියාව සහ අවශ්‍යතාව පවතී.

ශ්‍රී ලංකාවට සංචාරකයින් පැමිණීම පසුගිය කාල වකවානුව පුරාවට ම ක්‍රමානුකූල ව වර්ධනය විය. ශ්‍රී ලංකාවට සංචාරකයන් වැඩි වශයෙන් පැමිණෙන රටවල් ලෙස ඉන්දියාව, එක්සත් ජනපදය, චීනය, ජර්මනිය, ඕස්ට්‍රේලියාව, ප්‍රංශය සහ රුසියාව යන රටවල් සැලකිය හැකි ය. 2017 වර්ෂයේ දී විදේශීය සංචාරකයන් මිලියන 2.1ක් ශ්‍රී ලංකාවට පැමිණි අතර එය 2018 වර්ෂයේ දී මිලියන 2.3ක් දක්වා (ආදායම එක්සත් ජනපද ඩොලර් බිලියන 3.9 සිට එක්සත් ජනපද ඩොලර් බිලියන 4.4 දක්වා) සියයට 10කින් පමණ වර්ධනය විය (මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා). කෙසේ වුව ද, 2019 අප්‍රේල් මස පාස්කු ප්‍රහාරය හේතුවෙන් ඇති වූ තත්ත්වයන් තුළ 2019 වසරේ දී සංචාරක පැමිණීම් සියයට 18කින් පමණ පහළ ගියේ ය. එසේ ම, කොවිඩ් - 19 වසංගත තත්ත්වයන් හේතුවෙන් 2020 වසරේ දී සංචාරක පැමිණීම් සහ සංචාරක කර්මාන්තය දැඩි බලපෑමකට ලක් විය හැකි නමුත් සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාවට ඇති ඉහළ ආකර්ෂණය හේතුවෙන් මනා වැඩ පිළිවෙලක් තුළ සංචාරක කර්මාන්තය තිරසාර සංවර්ධනයක් අත්කර ගනු ඇතැයි අපේක්ෂා කළ හැකි ය.

**වගුව 01 : විවිධ රටවල ක්‍රියාත්මක නිවාස නවාතැන් ගැනීමේ සංකල්පය**

| අනු අංකය | රට | සංකල්පය |
|---|---|---|
| 1. | ඇමෙරිකා එක්සත් ජනපදය | ▪ කෘෂිකාර්මික නිවාස නවාතැන් ගැනීම් - Agricultural homestay<br>▪ අධ්‍යාපනික නිවාස නවාතැන් ගැනීම් - Educational homestay |
| 2. | කැනඩාව | ▪ සංස්කෘතික නිවාස නවාතැන් ගැනීම් - Cultural homestay<br>▪ උරුමයන් නිවාස නවාතැන් ගැනීම් - Heritage homestay |
| 3. | ඕස්ට්‍රේලියාව | ▪ ගොවිපලේ නිවාස නවාතැන් ගැනීම් - Farm homestay<br>▪ දේශීය ප්‍රජාව සමග නිවාස නවාතැන් ගැනීම් - Academic homestay with locally |
| 4. | දකුණු කොරියාව | ▪ අධ්‍යාපනික නිවාස නවාතැන් ගැනීම් - Educational homestay |
| 5. | දකුණු අප්‍රිකාව | ▪ විවේක නිවාස නවාතැන් ගැනීම් - Leisure homestay |
| 6. | නවසීලන්තය | ▪ ගොවිපලේ නිවාස නවාතැන් ගැනීම් - Farm homestay<br>▪ කුඩා ගෘහ කුටි තුළ නවාතැන් ගැනීම් - Cottage homestay |
| 7. | පිලිපීනය | ▪ සංස්කෘතික නිවාස නවාතැන් ගැනීම් - Cultural homestay |
| 8. | තායිලන්තය | ▪ සිසු නිවාස නවාතැන් ගැනීම් - Students homestay<br>▪ ස්වයං නිවාස නවාතැන් ගැනීම් - Volunteer homestay |
| 9. | ඉන්දුනීසියාව | ▪ සංස්කෘතික නිවාස නවාතැන් ගැනීම් - Cultural homestay<br>▪ විවේක නිවාස නවාතැන් ගැනීම් - Leisure homestay |

මූලාශ්‍රය :- Amran H (2008) Malaysian homestays from the perspective of young Japanese tourists: The quest for Furusato

## ශ්‍රී ලංකාවේ නිවෙස් නවාතැන් සංචාරක කර්මාන්තය

ශ්‍රී ලංකාවේ නිවෙස් නවාතැන් සංචාරක කර්මාන්තය ක්‍රම ක්‍රමයෙන් සංචාරකයන් අතර වඩාත් ජනප්‍රිය වෙමින් පවතින බව පෙනී යන අතර ඒ හරහා ග්‍රාමීය ප්‍රදේශවල සමාජ ආර්ථික වැඩිදියුණු වීමක් අපේක්ෂා කෙරේ. නිවෙස් නවාතැන් වැඩ සටහන් තුළ බලාපොරොත්තු වන තවත් අරමුණු වනුයේ තමන්ගේ ම ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ග්‍රාමීය ප්‍රජාව බල ගැන්වීම, ගම්බද ප්‍රදේශවලට සංචාරක ව්‍යාපාරය ව්‍යාප්ත කිරීම, සාම්ප්‍රදායික කෘෂිකර්මයෙන් බැහැර වී ඇති ග්‍රාමීය සමාජ ආර්ථික වටිනාකම් නැවත ඇති කිරීම, දේශීය සංස්කෘතික ලක්ෂණ/ගුණාංග ආරක්ෂා කිරීම සහ තිරසාර සංවර්ධන ඉලක්ක ජය ගැනීම ආදිය වේ.

විශේෂයෙන් ම, දශක තුනකටත් වඩා වැඩි කාලයක් අප රට තුළ පැවති කුරිරු ත්‍රස්තවාදය හේතුවෙන් සංචාරකයන් ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට මැලිකමක් දැක්වීය. කෙසේ වුව ද, 2009 වර්ෂයේ දී කාලයක් පුරාවට ම පැවති ත්‍රස්තවාදය අවසන් වීමත් සමඟ සංචාරකයන්ගේ ඇස නැවතත් ශ්‍රී ලංකාව දෙසට යොමු වන්නට පටන් ගැනිණි. එසේ පැමිණෙන සංචාරකයන් සඳහා පැවති සංචාරක හෝටල්වල දැඩි අඩු පාඩුවක් පැවති අතර එම අඩුව පිරවීම සඳහා නිවාස තාවකාලික නවාතැන් බවට පත් විය. එම තත්ත්වය නිවෙස් නවාතැන් සංකල්පය යනුවෙන් ශ්‍රී ලංකාව තුළ ව්‍යවහාරයට එක් විය.

ඒ කෙසේ වුව ද, ලොව පුරා ක්‍රියාත්මක වන්නා වූ මෙම නිවෙස් නවාතැන් සංකල්පය එම කර්මාන්තයේ නියත පුද්ගලයින් මනා ව අවබෝධ කර නො ගැනීම හේතුවෙන් එම අංශයේ දැඩි ප්‍රගතියක් ශ්‍රී ලංකාව තුළ දැක ගත නො හැකි විය.

**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් නිර්වචනය කර ඇති පරිදි නිවෙස් නවාතැන් සංකල්පය,**

1. ප්‍රජාමූල සංචාරක වැඩසටහනකි,
2. විවිධ තේමාවන් සහිත නිවාස/නවාතැන් ඒකක සකස් කිරීම තුළින් සංචාරක ප්‍රතිලාභ සමාජයේ විවිධ කොටස් වෙත බෙදා හරී,
3. සංචාරකයින්ගේ නවාතැන් ගැනීමේ අරමුණට සරිලන ගුණාත්මක ප්‍රමිතීන් සමගින් ශ්‍රී ලංකාවේ විවිධ ගමනාන්තවල පිහිටා ඇති අතර ශ්‍රී ලංකාවේ අව්‍යාජභාවය හෙළිදරව් කරයි,
4. ශ්‍රී ලාංකික ජීවන රටාව අත් විඳීමට සංචාරකයින්ට අවස්ථාව ලබා දෙමින් සංචාරකයින් සමඟ දේශීය ප්‍රජාව අතර අන්තර් ක්‍රියාකාරිත්වයක් ඇති කරයි.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරි වෙබ් පිටුවේ නිවෙස් නවාතැන් සංකල්පය යටතේ ලියාපදිංචි ව්‍යාපාරයන්හි ලැයිස්තුවක් දක්වා ඇති අතර වර්තමානයේ අන්තර්ජාලය තුළ ශ්‍රී ලංකාවේ නිවෙස් නවාතැන් සංකල්පය ප්‍රවර්ධනය කරනු ලබන වෙනත් වෙබ් අඩවි ද සැලකිය යුතු ප්‍රමාණයක් ඇත.

## නිවෙස් නවාතැන් සංකල්පයේ ඇති වාසි

1. දේශීය ප්‍රජාව සමඟ සම්බන්ධ වීම
2. මුදල් සඳහා වටිනාකමක් ලැබීම
3. නව ප්‍රදේශ කරා ගමන් කිරීම
4. දේශීය ජනතාව සමඟ ආහාර වේලක් බෙදා ගැනීම
5. තනි ව ගමන් ගන්නා අය සඳහා යෝග්‍ය වීම
6. භාෂා කුසලතාව වැඩිදියුණු වීම
7. දේශීය සංස්කෘතිය හා සිරිත් විරිත් ඉගෙන ගැනීමට ලැබීම
8. ගෙදර වගේ නවාතැන් සොයා ගැනීම
9. අමතක නො වන මතකයන්

## නිවෙස් නවාතැන් වර්ගීකරණය

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් නිවෙස් නවාතැන් සංකල්පය යටතේ විදේශිකයන්ට දෙනු ලබන නවාතැන් ස්ථාන පහත පරිදි වර්ගීකරණය කරනු ලබයි.

1. නිවෙස් නවාතැන් ඒකක - Home Stay Units
2. බංගලාව - Bungalow
3. කුලී නිවාස/කුලී මහල් නිවාස - Rented Houses/Rented Apartments

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි කරනු ලබන නිවෙස් නවාතැන් ඒකකවල

පවත්නා පහසුකම් සහ ලබා දෙන සේවය අනුව නැවත වර්ගීකරණයට ලක් කරනු ලබයි. ඒ අනුව, විවිධ නිර්ණායක මත සිදු කරන ස්ථානීය පරීක්ෂණයේ දී ලබා ගන්නා වූ ලකුණු ප්‍රමාණය මත Deluxe, Superior, Standard ලෙස නිවෙස් නවාතැන් ඒකක වර්ගීකරණය කරන අතර සෑම වර්ෂයක ම එය අලුත් කිරීමේ දී නැවත පරික්ෂාවක් සිදු කරනු ලබයි.

## ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙහි නිවෙස් නවාතැන් ඒකකයක් ලෙස ලියාපදිංචි කිරීම, සුදුසුකම් සහ මාර්ගෝපදේශයන්

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙහි ලියාපදිංචි වන නිවෙස් නවාතැන් ඒකකවලට එහි ලියාපදිංචි ආයතනයක් ලෙස ඉහළ පිළිගැනීමක් ලැබෙන අතර ලියාපදිංචි ඒකකයක් වශයෙන් නිල ලාංඡනයක් ප්‍රදර්ශනය කිරීමට හැකියාව ලැබේ. තව ද, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙහි ලියාපදිංචි වීම තුළ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් අවශ්‍ය වෘත්තීමය උපදෙස් නිරන්තරයෙන් ලබා ගත හැකි වීම, විවිධ වැඩමුළුවලට සහභාගී වීමේ අවස්ථාව ලැබීම, නිල වෙබ් අඩවිවල අලෙවි ප්‍රවර්ධන සහ අලෙවිකරණය සඳහා නොමිලේ අවස්ථාව ලැබීම, නවාතැන් මාර්ගෝපදේශක සටහනෙහි සහ නිවෙස් නවාතැන් ඒකක නාමාවලියෙහි නම සඳහන් වීම, විවිධ ප්‍රචාරණ අවස්ථාවන් ලැබීම, ජාතික සහ ජාත්‍යන්තර තොරතුරු කවුළු, සංචාරක සල්පිල්, සංචාරක නාමාවලි, මාර්ගෝපදේශ පොත් සහ සමාජ ජාලයන්හි අලෙවිකරණ අවස්ථා පහසු වීම සහ යම් යම් අවස්ථාවල දී දෙන මූල්‍ය ප්‍රතිලාභ ලබා ගත හැකි වීම වැනි ප්‍රතිලාභ රැසක් අත්කර ගැනීමට අවස්ථාව ලැබේ.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙහි ලියාපදිංචිය ලබා ගැනීමේ දී මූලික අවශ්‍යතා සමූහයක් සලකා බැලේ. පිහිටීම, පරිසරය, ප්‍රවේශය, නිවෙස් නවාතැන් ඒකකයේ තත්ත්වය, ගෙවත්ත, නඩත්තුව සහ වාහන ගාල් කිරීම ආදිය සලකා බැලේ. ඉදිරිපස වාඩි වී සිටීමට ඇති ප්‍රදේශය/ශාලාව, නිදන කාමර ප්‍රදේශය, කෑම කන ප්‍රදේශය සහ මුළුතැන්ගෙය ආදිය ද සලකා බලන කරුණු ය. එසේ ආගන්තුකයන් පැමිණීම සම්බන්ධයෙන් වන රෙජිස්ටරයක් පවත්වාගෙන යෑම, මුද්‍රාව තබන ලද බිල්පත් නිකුත් කිරීම සහ සහ සනීපාරක්ෂාව, ආරක්ෂාව, පිරිදුහාවය, කසල බැහැර කිරීම යන කරුණු කෙරෙහි ද අවධානය කරනු ලැබේ.

## නිවෙස් නවාතැන් ඒකක පිළිබඳ සිදු කළ සමීක්ෂණය

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් නිවෙස් නවාතැන් ඒකක සම්බන්ධයෙන් නිකුත් කර ඇති මාර්ගෝපදේශයන් පිළිබඳ අවධානය යොමු කරමින් මාතර සිට වැලිගම දක්වා වූ සංචාරක කලාපයේ නිවෙස් නවාතැන් ඒකක සංකල්පය යටතේ පවත්වා ගෙන යනු ලබන නියැදියක සමීක්ෂණයක් 2019 වසරේ දී සිදු කරන ලදී. මෙම කලාපය සංචාරක කර්මාන්තය සඳහා අධික ඉල්ලුමක් ඇති කලාපයක් බැවින් කලාපය තුළ නිවෙස් නවාතැන් ඒකක අවිධිමත් ආකාරයෙන් බිහි වී ඇති බව සිදු කළ සොයා බැලීම්වල දී පෙනී ගියේ ය. මෙම ප්‍රදේශය තුළ පවත්වා ගෙන යනු ලබන නිවෙස් නවාතැන් ඒකක ගහණයේ ස්වභාවය පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු නොමැති වීම හේතුවෙන් නියැදිය සඳහා නිවෙස් නවාතැන් ඒකක තෝරා ගැනීමේ දී එම ඒකක අහඹු ලෙස එම ප්‍රදේශය පුරා පැතිරී පවතින ලෙස තෝරා ගත්තේ ය. එහි දී සංචාරක හෝටල් හා ස්ථාන ප්‍රවර්ධන කටයුතු සිදු කරන විවිධ තුන්වන පාර්ශ්වීය වෙබ් අඩවිවලින් ලබා ගත් තොරතුරු මෙන් ම සමීක්ෂණ කටයුතු සිදු කළ නිවෙස් නවාතැන් ඒකකයේ අයිතිකරුවන් ගෙන් ලැබුණු තොරතුරු ද යොදා ගන්නා ලදී. මෙම සමීක්ෂණයේ දී පහත සඳහන් අංශ පිළිබඳ ව ප්‍රශ්නාවලියක් හරහා මුහුණට මුහුණ සාකච්ඡා කොට අධ්‍යයනය කරන ලදී.

1. නිවෙස් නවාතැන් ඒකකයන්ට අදාළ මූලික තොරතුරු
2. නිවෙස් නවාතැන් ඒකකයන්හි මූල්‍ය ක්‍රියාකාරිත්වය
3. නිවෙස් නවාතැන් ඒකකයන්ගේ ප්‍රචාරණ කටයුතු සඳහා තොරතුරු තාක්ෂණයේ භාවිතය
4. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය සහ එමගින් නිකුත් කර ඇති මාර්ගෝපදේශයන් මෙන් ම ඉන් ලබා දෙන සේවාවන් පිළිබඳ දැනුම්වත්භාවය
5. නිවෙස් නවාතැන් ඒකකයන්ගේ ප්‍රමිතිය
6. නිවෙස් නවාතැන් ඒකකයන්ගේ සාමාන්‍ය පරිපාලනය


ඉහත නිර්නායකයන්ට අදාළ ව සකස් කර ගත් ප්‍රශ්නාවලියක් ඇසුරෙන් නිවෙස් නවාතැන් ඒකක 23ක් පිළිබඳ ව අධ්‍යයනය කළ අතර එහි දී රැස් කර ගත් දත්ත පිළිබඳ විශ්ලේෂණයක් පහතින් දැක්වේ.


## නිවෙස් නවාතැන් ඒකක නියැදියට අදාළ මූලික තොරතුරු

නිවෙස් නවාතැන් ඒකක කිහිපයක් හැර අන් සියල්ල ම පවුල් ව්‍යාපාර ලෙස පවත්වා ගෙන යනු ලැබේ. බොහෝ නිවෙස් නවාතැන් ඒකක නිදන කාමර 2කින් හා පුද්ගලයන් 4 සිට 6 දෙනෙකුට නවාතැන් පහසුකම් ලබා දෙන ස්ථාන වේ. නිදන කාමර 3ක් සහිත නිවෙස් නවාතැන් ඒකක පැවතියේ 2ක් පමණක් වන අතර නිදන කාමර 4ක් හෝ ඊට වැඩි සහ 10 දෙනෙකුට වැඩි පිරිසකට නවාතැන් පහසුකම් සහිත නිවෙස් නවාතැන් ඒකක පැවතියේ 4ක් පමණි. බොහෝ නිවෙස් නවාතැන් ඒකක තම ව්‍යාපාරය තුළ ම අවන්හල් සේවාවන් පවත්වා ගෙන යයි. සංචාරකයන් සඳහා කුලී රථ සේවාවන් ද ලබා දේ. සංචාරකයන් සඳහා ලබා දෙනු ලබන අනෙකුත් සේවාවන් සැලකීමේ දී නිවෙස් නවාතැන් ඒකක 3ක සුපවේදන පන්ති පවත්වා ගෙන යනු ලබයි.


## නිවෙස් නවාතැන් ඒකකයන්හි මූල්‍ය ක්‍රියාකාරිත්වය

නිවෙස් නවාතැන් ඒකකවල පිරිවැටුම සැලකීමේ දී වාර්ෂික පිරිවැටුම රු. 600,000 ඉක්මවන බව සඳහන් කරනු ලැබුවේ එක් ස්ථානයක් පමණකි. පාඩු ලබමින් පවත්වා ගෙන යනු ලබන නිවෙස් නවාතැන් ඒකක 05 ක් ඒ අතර විය. නිවෙස් නවාතැන් ඒකකයන් අධික ණය ගැති භාවයකට ගොදුරු වී නැති අතර අඩකට වැඩි පිරිසක් ණය පහසුකම් සඳහා යොමු වී ඇත. ණය ප්‍රමාණයන් රුපියල් මිලියනයකට අඩු සීමාවක පවතී. කෙසේ වුව ද, නිවෙස් නවාතැන් ඒකක හිමිකරුවන් බොහෝ දෙනෙකු තුළ ඉදිරි ව්‍යාපාරික සාර්ථකත්වය පිළිබඳ ව පැවතියේ අවිනිශ්චිත තත්ත්වයකි.



නිවාස නවාතැන් ඒකකවල ව්‍යාපරික පරිසරය





ශ්‍රේණිගත කිරීම* :- 1 - යහපත්, 2 - සාමාන්‍යයි, 3 - අයහපත්


## නිවෙස් නවාතැන් ඒකකයන්ගේ ප්‍රචාරණ කටයුතු සඳහා තොරතුරු තාක්ෂණයේ භාවිතය

නිවෙස් නවාතැන් ඒකක බහුතරයක් තම ප්‍රචාරණ කටයුතු සඳහා තම නිවෙස් නවාතැන් ඒකකයට අනන්‍ය වූ වෙබ් අඩවියක් පවත්වා ගෙන යනු නො ලබන අතර තුන්වන පාර්ශ්වීය වෙබ් අඩවි හරහා ප්‍රචාරණ පහසුකම් ලබා ගනී. එසේ ම, නිවෙස් නවාතැන් ඒකක සඳහා සංචාරකයන් පැමිණීම එම තුන්වන පාර්ශ්වීය වෙබ් අඩවි හරහා කරනු ලබන වෙන් කිරීම් මත දැඩි ලෙස රඳා පවතින බව පෙනී ගිය ද සමහරක් නිවෙස් නවාතැන් ඒකක එම තුන්වන පාර්ශ්වීය වෙබ් අඩවිවල තම ව්‍යාපාරයේ තොරතුරු යාවත්කාලීන කිරීමක් සිදු කරනු නො ලබයි. මෙම නිවෙස් නවාතැන් ඒකක සඳහා සංචාරකයින්ගෙන් තුන්වන පාර්ශ්වීය වෙබ් අඩවිවල යහපත් ශ්‍රේණිගත කිරීම් ලැබී ඇති වුව ද සංචාරකයන් සමාලෝචනයන් ඉදිරිපත් කිරීමේ ප්‍රවණතාව දුර්වල මට්ටමක පවතී. කෙසේ වුව ද, ඉහත තුන්වන පාර්ශ්වීය වෙබ් අඩවි විසින් අය කරනු ලබන කොමිස් ගාස්තු ප්‍රතිශතයන් සම්බන්ධයෙන් මෙම නිවෙස් නවාතැන් ඒකක හිමිකරුවන් හට අවබෝධයක් නොමැති වීම විශේෂත්වයක් විය. එසේ ම, නිවෙස් නවාතැන් ඒකක වෙන් කරන අවස්ථාවේ දී ම සංචාරකයින්ගෙන් මුදල් අය කරන ආයතන වූයේ 02ක් පමණි.


නිවාස නවාතැන් ඒකකවල අන්තර්ජාල අලෙවිකරණය



නිවාස නවාතැන් ඒකක භාවිතා කරන තුන්වන පාර්ශවීය වෙබ් අඩවි




තුන්වන පාර්ශවීය වෙබ් අඩවි තුළ නිවාස නවාතැන් ඒකක ඇගයීම




## ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය සහ එමගින් නිකුත් කර ඇති මාර්ගෝපදේශයන් හා ලබා දෙන සේවා පිළිබඳ දැනුවත්භාවය

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය සහ එමගින් නිකුත් කර ඇති මාර්ගෝපදේශයන් හා ලබා දෙන සේවා පිළිබඳ දැනුවත්භාවය සම්බන්ධයෙන් සලකා බැලීමේ දී එම සමීක්ෂණය පහත සඳහන් කරුණු ඔස්සේ සිදු කරන ලදී.

1. ලියාපදිංචිය හා යාවත්කාලීන කිරීම
2. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය හරහා ලබා ගත් පහසුකම්

i. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිල ලාංඡනය ලබා ගැනීම හා ප්‍රදර්ශනය කිරීම

ii. ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් වෘත්තීයමය මාර්ගෝපදේශ ලබා ගැනීම

iii. පුහුණු වැඩ සටහන් සඳහා ලැබුණු අවකාශය

iv. ශ්‍රී ලංකා සංචාරකයන් සම්බන්ධයෙන් වන නවාතැන් මාර්ගෝපදේශක සටහනෙහි සඳහන් කිරීම

v. නිවාස නැවතුම් ඒකක නාමාවලියෙහි නම සඳහන් කිරීම

vi. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරන පොත් පිංචවල් සහ දැන්වීම් මගින් ප්‍රචාරණ කටයුතු සිදු කිරීමේ අවකාශය ලබා ගැනීම

vii. ජාතික සහ ජාත්‍යන්තර තොරතුරු කවුළු, සංචාරක සල්පිල්, සංචාරක නාමාවලි, මාර්ගෝපදේශයන් සහ සමාජ ජාලයන්හි අලෙවිකරණ අවස්ථා ගැනීම

සමීක්ෂණ නියැදියේ සහභාගී වූ නිවෙස් නවාතැන් ඒකකයන්ගෙන් එක් නිවෙස් නවාතැන් ඒකක 2ක් හැර අනෙකුත් සියලු නිවෙස් නවාතැන් ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි වී නොමැත.


## ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශයන්ට අදාළ ව නිවෙස් නවාතැන් ඒකකයන්ගේ ප්‍රමිතිය

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශයන්ට අදාළ ව නිවෙස් නවාතැන් ඒකකයන්ගේ ප්‍රමිතිය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී නිවෙස් නවාතැන් ඒකකය පිහිටි ස්ථානයේ සංචාරක ආකර්ෂණීත්වය, නවාතැන ඉදිරිපස පරිසරයේ ආකර්ෂණීයභාවය සහ නිවෙස් නවාතැන් ඒකකයන්හි නිදන කාමරවල ගුණාත්මකභාවය යන අංශ කෙරෙහි අවධානය යොමු කරන ලදී.

## නිවෙස් නවාතැන් ඒකකය පිහිටි ස්ථානයේ සංචාරක ආකර්ෂණීත්වය


නිවෙස් නවාතැන් ඒකකය පිහිටි ස්ථානයේ සංචාරක ආකර්ෂණීයත්වය සලකා බැලීමේ දී ආකර්ෂණීය ස්ථානයකට සමීප බව, ප්‍රවේශ වීමේ පහසුව, ගෘහයේ නඩත්තුව සහ ආරක්ෂිත වාහන ගාල් කිරීමේ හැකියාව යනාදිය කෙරෙහි අවධානය යොමු කළ අතර එහි දී පෙනී ගිය කරුණක් වූයේ ආකර්ෂණීය ස්ථානයකට සමීප බව, ප්‍රවේශ වීමේ පහසුව සහ ගෘහයේ නඩත්තුව යනාදිය සමස්තයක් ලෙස යහපත් බවයි. කෙසේ වුව ද, ආරක්ෂිත වාහන ගාල් කිරීමේ පහසුකම් නිවස්නයන්ගෙන් සියයට 39ක පමණ අයහපත් තත්ත්වයක පැවතුණි.

නිවාස නවාතැන් ඒකකය පිහිටි ස්ථානයේ සංචාරක ආකර්ෂණීත්වය




ශ්‍රේණිගත කිරීම* :- 1 - යහපත්, 2 - අයහපත්, 3 - අවබෝධයක් නොමැත

නිවාස නවාතැන් ඒකකය ඉදිරිපස පරිසරයේ ආකර්ෂණීයත්වය




ශ්‍රේණිගත කිරීම* :- 1 - යහපත්, 2 - අයහපත්, 3 - අවබෝධයක් නොමැත


## නිවෙස් නවාතැන් ඉදිරිපස පරිසරයේ ආකර්ෂණීයත්වය

නිවෙස් නවාතැන් ඒකකයන්හි ඉදිරිපස ආකර්ෂණීයභාවය සම්බන්ධයෙන් සලකා බැලීමේ දී නිවස ඉදිරිපස පරිසරය, ප්‍රමාණවත් බව හා නඩත්තුව, වාතාශ්‍රය හා ආලෝකය සහ වාඩි වීමේ පහසුකම් කෙරෙහි අවධානය යොමු කළ අතර එහි දී පෙනී ගිය කරුණක් වූයේ සමස්තයක් ලෙස නිවෙස් නවාතැන් ඒකකයන්හි ඉදිරිපස පරිසරය ආකර්ෂණීය ලෙස පවත්වා ගෙන යන බවයි.

## නිවෙස් නවාතැන් ඒකකයන්හි නිදන කාමරවල ගුණාත්මකභාවය

නිවෙස් නවාතැන් ඒකකයන්හි නිදන කාමරවල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් සලකා බැලීමේ දී නාන කාමර පහසුකම්, පිරිසිදුභාවය, වාතාශ්‍රය හා ආලෝකය, ඉඩ ප්‍රමාණය, ආරක්ෂාව හා පෞද්ගලිකත්වය, ජනෙල් හා ජනෙල් තිර, උෂ්ණත්ව පාලන උපකරණ සහ කාර්ය මණ්ඩලය සමග සන්නිවේදන පහසුකම් යනාදිය කෙරෙහි අවධානය යොමු කළ අතර එහි දී පෙනී ගිය කරුණක් වූයේ කාමර පහසුකම්, පිරිසිදුභාවය, වාතාශ්‍රය හා ආලෝකය සහ ආරක්ෂාව හා පෞද්ගලිකත්වය යනාදිය සමස්තයක් ලෙස නිවෙස් නවාතැන් ඒකකයන්හි යහපත් ලෙස පවත්වා ගෙන යන බවයි.


නිවාස නවාතැන් ඒකකයන්හි නිදන කාමරවල ගුණාත්මකභාවය - 1




ශ්‍රේණිගත කිරීම* :- 1 - යහපත්, 2 - අයහපත්, 3 - අවබෝධයක් නොමැත

එසේ ම, නිදන කාමරවල ඉඩ ප්‍රමාණය බොහෝ දුරට යහපත් තත්ත්වයක පැවතුණි.


නිවාස නවාතැන් ඒකකයන්හි නිදන කාමරවල ගුණාත්මකභාවය - 2




ශ්‍රේණිගත කිරීම* :- 1 - වර්ග අඩි 100 අඩු, 2 - වර්ග අඩි 100 - 120, 3 - වර්ග අඩි 120 වැඩි

ජනෙල් හා ජනෙල් තිර සහ උෂ්ණත්ව පාලන උපකරණ යනාදිය ද සමස්තයක් ලෙස නිවෙස් නවාතැන් ඒකකයන්හි යහපත් ලෙස පවත්වා ගෙන යයි. කෙසේ වුව ද, නිදන කාමරවල සිට කාර්ය මණ්ඩලය සමග පවතින සන්නිවේදන පහසුකම් අයහපත් තත්ත්වයක පැවතුණි.

නිවාස නවාතැන් ඒකකයන්හි නිදන කාමරවල ගුණාත්මකභාවය - 3





ශ්‍රේණිගත කිරීම* :- 1 - යහපත්, 2 - අයහපත්, 3 - අවබෝධයක් නොමැත

## නිවෙස් ඒකකවල හිමිකාරිත්වය

ව්‍යාපාරයේ අයිතිකාරිත්වය හා පරිපාලන අධිකාරිය සම්බන්ධයෙන් සැලකීමේ දී සමස්තයක් ලෙස ව්‍යාපාරික ස්ථානයේ අයිතිකරු විසින් ම පවුලේ ව්‍යාපාරයක් ලෙස  නිවෙස් නවාතැන් ඒකකයන් පවත්වා ගෙන යන බව පෙනී යන ලදී.

ව්‍යාපාරයේ සාමාන්‍ය පරිපාලනය - 3




ශ්‍රේණිගත කිරීම* :- 1 - අයිතිකරු විසිනි, 2 - දේශීය බදු, 3 - විදේශීය බදු

කෙසේ වුව ද, මෙම නිවෙස් නවාතැන් ඒකකවල සාමාන්‍ය පරිපාලනයේ පවතින දුර්වලතාවලට සහ ව්‍යාපාරික කටයුතු ක්‍රමවත් ව පවත්වා ගෙන යෑමට එම පරිපාලකවරුන්ට තම පාරිභෝගිකයන් භාවිත කරන විදේශ භාෂා පිළිබඳ සහ ඔවුන් සමග කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු යහපත් චාරිත්‍ර පිළිබඳ පවතින සීමිත දැනුම බලපා ඇති බව පෙනී යන ලදී. සංචාරකයන් පිළිගැනීම හා ආචාර කිරීම, සංචාරකයන් සමග සරල

පණිවුඩ හුවමාරුව, සංචාරකයා හට ඇතුළත් වීමේ ක්‍රියාවලියට අදාළ කටයුතු සඳහා සහාය වීම (Check-in Formalities), කාමර සේවයේ මූලික අවශ්‍යතා සම්බන්ධ කටයුතුවලට සහාය වීම සහ සංචාරකයන්ගේ පැමිණිලි අවබෝධ කර ගැනීම හා ප්‍රතිචාර දැක්වීම සහ හෝටලයේ පහසුකම් හා ක්‍රියාකාරකම් පිළිබඳ ව සංචාරකයන්ට සන්නිවේදනය කිරීම ආදිය නිසි ලෙස සිදු කිරීම සඳහා අවශ්‍ය විදේශීය භාෂා දැනුම ඔවුන් අතර ඉතා අල්ප විය.

## සමස්ත ඇගැයීම සහ නිගමන

නිවෙස් නවාතැන් ඒකකවලින් මූලික වශයෙන් ලබා දෙනු ලබන්නේ නවාතැන් පහසුකම් වන අතර ඒ හරහා සංචාරකයන් සඳහා අනෙකුත් සේවාවන් ලබා දීම තුළින් තම ව්‍යාපාරයන් තුළ අගය එකතු කර ගැනීමකට යොමු වීමේ දුර්වලතාවක් ඇති බව පෙනී ගියේ ය. විශේෂයෙන් ම, ප්‍රමිතියෙන් යුත් අවන්හල් සේවා, කුළී රථ සේවා සම්බන්ධකම්, ශ්‍රී ලාංකික සංස්කෘතිය හා බැඳුනු ක්‍රියාකාරකම්, සාම්ප්‍රදායික සූපවේදන ක්‍රම, භාවනා හා යෝග වැඩමුළු, පාරම්පරික හා ආයුර්වේද වෙදකම් වැනි සේවාවන් හරහා තම ව්‍යාපාරයන්ට වැඩි අගයක් එකතු කර ගැනීමේ අවශ්‍යතාවක් ඇති බව ද පෙනී ගියේ ය.

නිවෙස් නවාතැන් ඒකක මූල්‍ය පරිපාලනය හා ගිණුම් කටයුතු සිදු කිරීමේ දුර්වලතා දක්නට ලැබුණි. එසේ ම, තම ව්‍යාපාර ප්‍රමිතීන් වර්ධනයට විවිධ ආයතන විසින් ලබා දෙනු ලබන මූල්‍ය සහනයන් පිළිබඳ අවබෝධයක් නොමැති වීමේ ගැටලුවක් පැවතුණි. කෙසේ වුව ද, නිවෙස් නවාතැන් ඒකක සඳහා මිල ගණන් තැබීමේ දී ක්ෂේත්‍රය තුළ සම්මුතියක් නො පවතින බවත් අනවශ්‍ය ලෙස ඒවායේ මිල ගණන් අඩු කරන බවත් පෙනී ගියේ ය.

නිවෙස් නවාතැන් ඒකක සංචාරක ක්ෂේත්‍රයේ ව්‍යවසායකයන් තම ව්‍යාපාර ප්‍රවර්ධන කටයුතු සඳහා තාක්ෂණය භාවිතයේ මද බවක් සහ භාවිත කරන තාක්ෂණික මෙවලම් ඵලදායී ලෙස යොදා නො ගන්නා තත්ත්වයක් මෙම සමීක්ෂණය තුළ දී දැකිය හැකි විය. වර්තමාන තත්ත්වයන් තුළ තම ව්‍යාපාරය සඳහා වෙබ් අඩවියක් සකස් කර ගැනීම ඉතා අඩු පිරිවැයක් යටතේ පහසුවෙන් සිදු කළ හැකි වුව ද ඒ සඳහා යොමු වීමක් නොමැත. එසේ ම, වර්තමානය වන විට සංචාරක හෝටල් හා ස්ථාන ප්‍රවර්ධන කටයුතු සිදු කරන විවිධ තුන්වන පාර්ශ්වීය වෙබ් අඩවි පැවතියත් එම වෙබ් අඩවි විසින් ලබා දෙන සේවා පිළිබඳ නිසි අවබෝධයක් නොමැති වීම සහ එම සේවා කාර්යක්ෂම ලෙස කළමනාකරණය නො කිරීම මගින් මෙම සංචාරක අංශයට වැඩි ප්‍රතිඵල අත් කර ගැනීමට නොහැකි වී ඇත. විශේෂයෙන් ම, තුන්වන පාර්ශ්වීය වෙබ් අඩවි විසින් අය කරනු ලබන කොමිස් මුදල් පිළිබඳ අධ්‍යයනයකින් තොර ව ඒ හරහා ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම, නිවෙස් නවාතැන් ඒකකය විවිධ තුන්වන පාර්ශ්වීය වෙබ් අඩවි හරහා අලෙවි කිරීමේ දී වෙන් කර ගැනීම් සට්ටනයන් ඇති වීම, තුන්වන පාර්ශ්වීය වෙබ් අඩවි හරහා වෙන් කර ගැනීම් සඳහා යම් අත්තිකාරම් මුදලක් අය කිරීමක් හෝ වෙන් කිරීමක් අවලංගු කිරීමේ දී ගාස්තුවක් අය නො කිරීම, ඒ හේතුවෙන් සම්පත් අපතේ යෑමක් සිදු වීම, සංචාරක පාරිභෝගිකයන් සිදු කරන ශ්‍රේණිගත කිරීම් හා සමාලෝචන පිළිබඳ උනන්දුවක් නො දැක්වීම හා නිසි ප්‍රතිචාරයන් නො දැක්වීම, තුන්වන පාර්ශ්වීය වෙබ් අඩවිවල තම ව්‍යාපාරයන් නිසි ලෙස යාවත්කාලීන නො කිරීම සහ සමාජජාල හා විද්‍යුත් තැපැල භාවිතයෙන් ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම දුර්වල මට්ටමක පැවතීම වැනි කරුණු ඒ සඳහා බලපා ඇති බව දැක්විය හැකි ය. ඒ අනුව, මෙම සංචාරක අංශය වෙත තාක්ෂණික දැනුම විධිමත් අයුරින් ගෙන යෑම ඉතා ප්‍රතිඵලදායී වනු ඇත.

සමස්තයක් ලෙස නිවෙස් නවාතැන් ඒකකවල පහසුකම් යහපත් මට්ටමක පැවති බව සමීක්ෂණය තුළ අනාවරණය විය. නිවෙස් නවාතැන් ඒකකය පිහිටි ස්ථානයේ සංචාරක ආකර්ෂණීත්වය, නිවෙස් නවාතැන ඉදිරිපස පරිසරයේ ආකර්ෂණීයභාවය, නිවෙස් නවාතැන් ඒකකයන්හි නිදන කාමරවල ගුණාත්මකභාවය ආදියෙහි ප්‍රමිතිය යහපත් මට්ටමක් පැවතිණ. කෙසේ වුව ද, නිවෙස් නවාතැන් ඒකකයන්හි ආරක්ෂිත වාහන ගාල් කිරීමේ පහසුකම් ඇති කිරීමට සහ නිදන කාමරවල සිට කාර්ය මණ්ඩලය සමඟ පවතින සන්නිවේදන පහසුකම් ක්‍රමවත් කිරීමට කටයුතු කිරීම පාරිභෝගික ආකර්ෂණය වැඩි දියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය වනු ඇත.

නිවෙස් නවාතැන් ඒකකවල සාමාන්‍ය පරිපාලනයේ පවතින දුර්වලතා අපගේ සමීක්ෂණයේ දී කැපී පෙනිණි. මේ අනුව, පැමිණීම් රෙජිස්ටරයක් පවත්වා ගැනීම, ආයතනික බිල්පත් නිකුත් කිරීම, ව්‍යාපාරයේ විධිමත්භාවය ප්‍රදර්ශනය කිරීම ආදියෙහි වැදගත්කම

පිළිබඳ අවධානය දුර්වල වීම සහ සංචාරක නියාමන අධිකාරීන්ගේ නියාමනයට සහ අධීක්ෂණයට ලක්වීමෙන් ව්‍යාපාරයට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ අවබෝධයක් නොමැති වීම තුළ මෙම සංචාරක අංශයට අපේක්ෂිත අගයන් අත් කර ගැනීමට නො හැකි වී ඇත. සංචාරක පැමිණීම් සහ පිටවීම් පිළිබඳ නිසි ලෙස දත්ත රැස් නො කිරීම මෙම සංචාරක අංශය පිළිබඳ අධ්‍යනයන් හා වැඩිදියුණු කිරීම් සිදු කිරීම සඳහා බාධාවක් වනු ඇති අතර සංචාරකයන්ගේ ආරක්ෂාවට හා නිවෙස් නවාතැන් ඒකකවල ආරක්ෂාවට මෙන් ම ජාතික ආරක්ෂාවට ද අහිතකර ලෙස බලපානු ඇත. එසේ ම, මෙම පරිපාලන දුර්වලතා මෙම සංචාරක අංශයේ තිරසාර සංවර්ධනයට බාධකයක් වනු ඇත. තව ද, නිවෙස් නවාතැන් ඒකකවල පරිපාලකවරුන්ට තම ප්‍රධාන සංචාරක පාරිභෝගිකයන්ගේ මවු භාෂා දැනුම වර්ධනය කිරීම තුළින් සංචාරක ආගන්තුක සත්කාර සේවාවන් නිසි ලෙස පවත්වා ගෙන යෑමට අවශ්‍ය සන්නිවේදන හැකියාවන් දියුණු කිරීම අත්‍යවශ්‍ය වනු ඇත.

2019 වසරේ අප්‍රේල් මස එල්ල වූ පාස්කු ප්‍රහාරයෙන් සංචාරක අංශය වෙත වූ බලපෑමත් 2020 වසරේ මාර්තු මස රට තුළ ව්‍යාප්ත වූ කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් සංචාරක අංශය වෙත එල්ල වෙමින් පවතින දැඩි බලපෑමත් මෙම කලාපය තුළ නිවෙස් නවාතැන් ඒකකවල ඉල්ලුම බොහෝ සෙයින් ම විදේශ සංචාරකයන් මත රඳා පැවතීම මෙම තත්ත්වය සඳහා බලපා ඇති බව පෙනී යයි. ඒ අනුව, සංචාරක කර්මාන්තය තුළ ප්‍රචලිත වෙමින් පවතින මෙම නිවෙස් නවාතැන් සංකල්පය තිරසාර වර්ධනයක් අත් කර ගැනීම සඳහා එම අංශය බාහිර කම්පන වෙත මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා පියවර ගැනීම ද අත්‍යවශ්‍ය වනු ඇත.

මූලාශ්‍ර:


1. https://www.sltda.gov.lk/home-stay - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
2. ශ්‍රී ලංකා මහ බැංකුව - වාර්ෂික වාර්තා 2017, 2018, 2019
3. Amran H (2009) Handbook on Community Based Tourism: "How to Develop and Sustain CBT"
4. Amran H (2008) Malaysian homestays from the perspective of young Japanese tourists: The quest for Furusato





## මූල්‍ය සාක්ෂරතාවෙන් බිඳක්...

# මුදල් පරිහරණයේදී කල්පනාකාරී වෙමු

### ඔබේ මුදල්වල කළමනාකරු ඔබමයි.

- මුදල් උපයන්නා ඔබයි.
- නීතියෙන් පිළිගත් රැකියාවකින් හෝ ව්‍යාපාරයකින් ම මුදල් උපයා ගන්න ඕන.
- මුදල් ඉපයීම සඳහා ඔබේ ධනය, කාලය හා ශ්‍රමය වැය කරන්න සිදු වෙනවා.
- මුදල් ඉපයීම අමාරුයි. ඒ උනාට වියදම් කිරීම නම් ඉතා ම පහසුයි.
- ඉපයීමට තියෙන අවස්ථා අඩුයි. නමුත් වියදම් කිරීමට නම් අවස්ථා ඕනෑ තරම්.

**ඉතින්, අමාරුවෙන් උපයාගත් මුදල් ඉවක් බවක් නැති ව වියදම් කරනවා ද? සැලසුමකට අනුව වියදම් කරනවා ද? තීරණය කළ යුත්තේ ඔබමයි.**

**මුදල් කළමනාකරණය කරනවා කියන්නේ සැලසුමකට අනුව මුදල් පාලනය කිරීමයි.**

### උපයන මුදලින් කොටසක් නිතිපතා ඉතිරි කිරීමෙන් ඔබේ මතු ආරක්ෂාව තහවුරු වේ

- ආදායමෙන් කොටසක් නිතිපතා ඉතිරි කිරීමට පුරුදු වුනොත් කාලයක් ගතවන විට ඔබටත් නො දැනීම ලොකු අරමුදලක් එක් රැස් වෙයි.
- ඔබට ලැබෙන ආදායම අනුව ඉතිරි කළ හැකි ප්‍රමාණය තීරණය කරන්න. **ආදායම ලද විගස ම මුලින් ම ඒ කොටස ඉතිරි කරන්න.**
- ඉතිරි කිරීම පුරුද්දක් කර ගන්න.
- ඉතිරි කිරීමෙන් සතුටු වන්න.

### මුදල් ඉතිරි කිරීමේ දී අපි කල්පනාකාරී විය යුතු වෙමු.

- මහජනයාගේ ඉතුරුම් තැන්පත් භාර ගැනීමට නීතියෙන් බලය හා අවසරය ඇති ස්ථාවර මූල්‍ය ආයතනවල පමණක් මුදල් තැන්පත් කළ යුතු යි.
- ඔබ ඉල්ලූ විට ඔබේ මුදල් ආපසු ගෙවීමට එම ආයතනවලට හැකියාවක් ඇත්දැයි කල් ඇති ව විමසා දැන ගත යුතු යි.
- ආකර්ෂණීය වෙළෙඳ ප්‍රචාරණවලට හසු නො වී ඔබේ මුදල් තැන්පත් කලයුතු ආයතනය තෝරා ගත යුතු යි.
- කෙටි කාලයක දී අධික ලාභයක් ගත හැකි යැයි පවසන ප්‍රෝඩාකාරී මුදල් මගඩිවලට හසු නො වීමට වග බලා ගත යුතු යි.
- අධික පොලීවලට නො රැවටෙන්න. තැන්පත් මුදලේ ආරක්ෂාව ගැනත් සැලකිලිමත් වන්න.

**සියලු ම වියදම් හිතේ හැටියට වියදම් කළ පසු අතේ ඉතිරි වන මුදල ඉතිරි කිරීමක් නො වේ.**

**තමන් උපයා ගන්නා මුදල් නිසි ලෙස පරිහරණය කිරීමට පුද්ගලයකු සතු දැනුම හා හැකියාවට මූල්‍ය සාක්ෂරතාව යැයි කියනු ලැබේ. ඔබත් ඔබේ මූල්‍ය සාක්ෂරතාව වැඩිදියුණු කර ගන්න.**

# වලක වැටෙන්නට පෙර




**පිරමිඩ වලට හසුවී තමන්ගේ මුදල් නැති කර ගන්න එපා !**

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA